2010

# කාර්ය සාධන වාර්තාව



ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
තැ.පෙ 14,පේරාදෙණිය


## අන්තර්ගතය


| | |
|---|---|
| කාර්ය සාධන පැතිකඩ | පිටුව 03 |
| හැඳින්වීම | පිටුව 04 |
| කාර්ය සාධනය | පිටුව 07 |
| රාජකීය උද්භිද උද්‍යානය | පිටුව 12 |
| මල් වගා පර්යේෂණ සහ සංවර්ධන ඒකකය | පිටුව 15 |
| ජාතික ශාකාගාරය | පිටුව 24 |
| හක්ගල උද්භිද උද්‍යානය | පිටුව 30 |
| ගම්පහ උද්භිද උද්‍යානය | පිටුව 35 |
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානය | පිටුව 38 |
| හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානය | පිටුව 39 |
| අවිස්සාවේල්ල තෙත් කලාපීය උද්භිද උද්‍යානය | පිටුව 41 |
| අතිගරු ජනාධිපතිතුමා සහ අගමැතිතුමාගේ නිළ නිවාස උද්‍යාන | පිටුව 43 |
| පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකකය | පිටුව 43 |
| 2011 ක්‍රියාකාරි සැලැස්ම | පිටුව 44 |

# කාර්ය සාධන පැතිකඩ

## 2010 වර්ෂයේ ආදායම

රු. 179,650,020.48




## නරඹන්නන්ගේ පැමිණීම

| ඒකකය | 2009 | | 2010 | |
|---|---|---|---|---|
| | විදේශිය | දේශිය | විදේශිය | දේශිය |
| පේරාදෙණිය | 117,427 | 997,997 | 200,468 | 1,089,282 |
| හක්ගල | 5,871 | 508,913 | 10,287 | 458,696 |
| ගම්පහ | 127 | 197,443 | 194 | 153,431 |
| **එකතුව** | **123,425** | **1,704,353** | **210,949** | **1,701,409** |

## 2010 වර්ෂයේ මුළු වියදම

| විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිපාදන ශේෂය | % |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන වැය | 150,590,000.00 | 148,924,872.00 | 1,664,137.00 | **98.8** |
| පුනරාවර්තන වැය | 154,728,000.00 | 149,778,667.00 | 4,949,333.00 | **96.8** |

# 1. හැඳින්වීම

## 1.1 පසුබිම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව, ශාක විතැන් සංරක්ෂණය හා ශ්‍රී ලංකාවේ උද්‍යාන අලංකරණ විද්‍යාව ප්‍රවර්ධනය සඳහා පර්යේෂණාත්මක හා තාක්ෂණික වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදී මහඟු දායකත්වයක් ලබාදෙයි.

මෙම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියළුම උද්භිද උද්‍යාන 19 වන ශත වර්ෂයේ මුල් භාගයේදි ආරම්භ වූ පුරෝගාමි උද්භිද උද්‍යාන වේ. අග්නිදිග ආසියාතික කලාපයට සුවිශේෂී වූ නිවර්තන සහ ආවේණික ශාක සංකලනය අධ්‍යයනය පිළිබඳව ජාතික සහ ජාත්‍යන්තර ගෞරවාදරයට පත් වූ මධ්‍යස්ථානයක් වශයෙන් උද්‍යාන පිළිගැනිමට පාත්‍ර වි ඇත. ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන ලොව පුරා ප්‍රචලිත වි ඇති අතර සෑම වසරක ම නරඹන්නන් මිලියන 1.8 කට වැඩි ප්‍රමාණයක් උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණ ඇත.

රාජකිය උද්භිද උද්‍යානය, පේරාදෙණිය (1821), හක්ගල උද්භිද උද්‍යානය (1861) සහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය, ගම්පහ (1876) යන උද්භිද උද්‍යාන බ්‍රිත්‍යානයන් විසින් පිහිටුවන ලදි. 1950 දි ප්‍රථම වන ඖෂධ උද්‍යානය පිහිටුවන ලද්දේ ඖෂධ පැළෑටි සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සහ ඒවා රඳවා ගැනිමට හෝ ආරක්ෂා කර පවත්වාගෙන යාමට මෙන්ම ශ්‍රී ලංකාවේ ඖෂධ පැළෑටි සමුහය කළමනාකරණය කිරිමට ය. ඒ හැර හම්බන්තොට වියළි කලාපීය සහ අවිස්සාවේල්ල තෙත් කලාපිය උද්භිද උද්‍යාන පහතරට වියළි සහ තෙත් පැළෑටි සංරක්ෂණය සඳහා 2011 වර්ෂයේදි ආරම්භ කිරිමට නියමිත ය.

1912 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවිමෙන් අනතුරුව උද්භිද උද්‍යාන එකී දෙපාර්තමේන්තුවේ අංශයක් වශයෙන් ක්‍රියාත්මක වූ අතර 2006 වර්ෂයේදි ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ජනරාල් යටතේ ස්ථාපිත කරන ලදි. මෑත භාගය වන විට එය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ශාක සංරක්ෂණය සහ පර්යේෂණ සඳහා පුරෝගාමි ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ දැක්ම

**ශ්‍රී ලංකාවේ විතැන් සංරක්ෂණයේ ප්‍රධාන මධ්‍යස්ථානය වෙමින් දේශිය ආර්ථික ප්‍රවර්ධනය උදෙසා උපරිම දායකත්වයක් ලබාදෙන අතර උද්භිද විද්‍යාත්මකව හා සෞන්දර්යාත්මකව වර්ෂ 2015 වන විට ලෝකයේ හොඳම නිවර්තන කලාපීය උද්භිද උද්‍යාන බවට පත්විම.**

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මෙහෙවර

**ජනතාව උදෙසා ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ නිර්මිත පරිසරයන්හි ඇති ශාක සම්පත් අධ්‍යයනය, තිරසාර සංරක්ෂණය සහ ආශ්වාදය සඳහා අවස්ථාව ලබාදිම**

## 1.2 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ශ්‍රී ලංකාවේ ශාක විවිධත්වය සංරක්ෂණය කිරීමට විතැන් සංරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම.
- අධ්‍යාපන සහ සන්නිවේදන ක්‍රම උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ ශාක සම්පත් පිළිබඳව හා ශාක සම්පත් හා බැඳි පවත්නා විවිධ වූ කර්මාන්ත සඳහා අවශ්‍යවන්නා වූ නිවැරදි තොරතුරු හා ශිල්පීය ඥානය ලබාදීමට වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ මල්වගා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන්නා වූ විවිධ පර්යේෂණ සහ තාක්ෂණ ක්‍රමවේද අත්හදා බැලීම සහ ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ ජාතික උද්භිද උද්‍යාන උසස් මට්ටමකින් පවත්වාගෙන යාම.
- සුදුසු ස්ථානවල නව උද්භිද උද්‍යාන පිහිටුවීම සඳහා අවශ්‍යවන්නාවූ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැංවීම.
- උද්‍යාන අලංකරණ විද්‍යාව ශ්‍රී ලංකාවේ ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සහ තාක්ෂණ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ශ්‍රී ලංකාවේ හඳුනාගත් ඓතිහාසික වටිනාකමකින් යුතු වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සඳහා තාක්ෂණික උපදෙස් ලබාදීම.
- අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ සෞඛ්‍ය ආරක්ෂාව යහපත්ව පවත්වාගෙන යාම.

## 1.3 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන සහ ඒකක

1. රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය.
2. හක්ගල උද්භිද උද්‍යානය , හක්ගල.
3. හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය , ගම්පහ.
4. ජාතික ශාකාගාරය, පේරාදෙණිය.
5. වන ඖෂධ උද්‍යානය , ගනේවත්ත
6. වියළි කලාපීය උද්භිද උද්‍යානය, මිරිජ්ජවිල, හම්බන්තොට.
7. සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානය, ඉලුක්ඕවිට, අවිස්සාවේල්ල
8. මල්වගා පර්යේෂණ හා සංවර්ධන අංශය, පේරාදෙණිය.
9. අධ්‍යාපන මධ්‍යස්ථානය, පේරාදෙණිය.
10. ජනාධිපති මැදුර උද්‍යානය, කොළඹ.
11. ජනාධිපති මැදුර උද්‍යානය, මහනුවර.
12. ජනාධිපති මැදුර උද්‍යානය , නුවරඑළිය.
13. ජනාධිපති මැදුර උද්‍යානය, අනුරාධපුරය.
14. අරලියගහ මන්දිර උද්‍යානය, කොළඹ.
15. අග්‍රාමාත්‍ය කාර්යාලීය උද්‍යානය, කොළඹ.
16. අගමැති මැදුර උද්‍යානය, නුවරඑළිය.
17. විසුම්පාය, අගමැති මැදුර උද්‍යානය.
18. සුවහස් මල් සෙවන, නිදහස් චතුරස්‍රය කොළඹ.
19. උද්‍යානය සහායක කාර්යාලය, නාරාහේන්පිට.
20. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්, ඒකකය, පිටකන්ද, මහනුවර.
21. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්, ඒකකය, බොරැල්ල.
22. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්, ඒකකය, ජාවත්ත .
23. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන්, ඒකකය, නිලාවෙලි, ත්‍රිකුණාමලය.
24. හරිත පියස පුහුණු මධ්‍යස්ථානය, මීගලෑව.

## 1.4 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

අනුමත සේවක සංඛ්‍යාව : 699

වත්මන් සේවක සංඛ්‍යාව: 423 ( මාණ්ඩලික නිලධාරින් 17, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරින් 37, කෘෂි මෙහෙයුම් උපාධිධාරී නිලධාරින් 03, උපාධිධාරී වැඩසටහන් සහකාර නිලධාරින් 20 සහ කළමනාකරණ සහකාර සේවයේ නිලධාරින් 28)

**සේවක ආකෘතිය**


| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 17 |
| තෘතිය මට්ටම | 58 | 33 |
| ද්විතීය මට්ටම | 95 | 72 |
| ප්‍රාථමික මට්ටම | 515 | 301 |
| සමෘද්ධි නිලධාරින් | - | 12 |
| කොන්ත්‍රාත් පදනම මත | - | 255 |
| එකතුව | **699** | **690** |


# 2. කාර්ය සාධනය


## 2.1 නරඹන්නන්ගේ තොරතුරු

පේරාදෙණිය, හක්ගල සහ ගම්පහ උද්භිද උද්‍යාන නඩත්තුව ඉහල මට්ටමකින් පවත්වාගෙන ගිය අතර මෙම වර්ෂයේ 1,912,385 ක් ( දේශිය සංචාරකයින් 1,701,409 සහ විදේශිය සංචාරකයින් 210,949) උද්භිද උද්‍යාන නරඹා ඇති අතර සංසන්දනය කර බලන විට පෙර වසරට වඩා නරඹන්නන්ගේ සංඛ්‍යාව 6 % කින් වැඩි වී ඇත. එසේම උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාව 2010 වර්ෂයේ 210,949 වන අතර එය ගිය වර්ෂය හා සසඳා බලන විට (123,425) 71% වැඩිවීමක් පෙන්නුම් කරයි.

| නරඹන්නන් කාණ්ඩය | පේරාදෙණිය | හක්ගල | ගම්පහ | එකතුව |
|---|---|---|---|---|
| **දේශිය වැඩිහිටි** | 839,327 | 334,824 | 137,335 | **1,311,486** |
| **දේශිය ළමුන්** | 249,955 | 123,872 | 16,096 | **389,923** |
| එකතුව (දේශිය නරඹන්නන්) | **1,089,282** | **458,696** | **153,431** | **1,701,409** |
| **විදේශිය වැඩිහිටි** | 190,278 | 9,131 | 182 | **199,591** |
| **විදේශිය ළමුන්** | 6,060 | 684 | 9 | **6,753** |
| **විදේශිය ශිෂ්‍ය** | 4,130 | 472 | 3 | **4,605** |
| එකතුව ( විදේශිය නරඹන්නන්) | **200,468** | **10,287** | **194** | **210,949** |
| නරඹන්නන්ගේ මුළු එකතුව | **1,289,750** | **468,983** | **153,625** | **1,912,358** |




දේශිය නරඹන්නන්ගේ මුළු එකතුව
2000000
1900000
1800000
1700000
1600000
1500000
1400000
1300000
1200000
1100000
1000000
900000
800000
700000
600000
500000
400000
300000
200000
100000
0
එකතුව


උද්‍යාන ත්‍රිත්වයේ මුළු නරඹන්නන්
නරඹන්නන්ගේ මුළු එකතුව
2,500,000
2,000,000
1,500,000
1,000,000
500,000
0
2006
2007
2008
2009
2010
එකතුව
,493,982
1,673,092
1,478,153
1,800,542
1,912,358

## 2.2. ආදායම් තොරතුරු

ඇතුළුවීමේ ගාස්තු, පැළ අලෙවිය සහ කුළියටදීම්වලින් රුපියල් මිලියන 179.6 මුදලක් මුළු ආදායම වශයෙන් උපයන ලදී. එය 2009 වර්ෂයේ එම කාලපරිච්ඡේදය තුළදී (රුපියල් මිලියන 128.7) ඉපැයූ මුළු ආදායම ඉක්මවා යාමකි.

| ඒකකය | මුළු ආදායම (රුපියල්) |
|---|---|
| රාජකීය උද්භිද උද්‍යානය , පේරාදෙණිය | 148,259,439.72 |
| හක්ගල උද්භිද උද්‍යානය | 19,563,979.12 |
| ගම්පහ උද්භිද උද්‍යානය | 7,745,576.50 |
| වියළි කලාපිය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 17,915.00 |
| වන ඖෂධ උද්‍යානය, ගනේවත්ත | 800,172.70 |
| ටොරින්ටන් පැළ තවාන, කොළඹ | 1,999,017.44 |
| උද්භිද උද්‍යාන භාරකාර අරමුදල | 1,263,920.00 |
| **මුළු එකතුව** | **179,650,020.48** |

### 2.3 රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ තොරතුරු

**අංකය: 32201**

| | වැය (රුපියල්) උපරිම සීමාව | අය (රුපියල්) අවම සීමාව | හර ශේෂය (රුපියල්) උපරිම සීමාව |
|---|---|---|---|
| **අයවැය ඇස්තමේන්තුව - 2010** | **20,000,000.00** | **8,100,000.00** | **49,000,000.00** |
| **ප්‍රතිශෝධිත සීමාව** | **-** | **-** | **-** |
| **සත්‍ය දත්ත** | **18,211,797.00** | **10,039,878.51** | **41,147,427.54** |

## 2.4 වැය

### 2.3.1 ප්‍රාග්ධන වියදම්

| උප ව්‍යාපෘති | විෂය මූලක කේතය | විෂය මූලක විස්තර | 2010 වර්ෂයේ අයවැයෙහි ශුද්ධ ප්‍රතිපාදන රු.(000) | මුළු වැය රු.(000) | ඉතිරි ප්‍රතිපාදන රු.(000) | % |
|---|---|---|---|---|---|---|
| | | <u>ගොඩනැගිලි සහ නිර්මාණ ප්‍රතිසංස්කරණය කිරීම</u> | | | | |
| 0 | 2001 | ගොඩනැගිලි සහ නිර්මාණ | 650 | 638.152 | 11.857 | 98 |
| 0 | 2002 | පැළෑටි, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 300 | 297.684 | 2.316 | 99 |
| 0 | 2003 | වාහන | 500 | 492.290 | 6.710 | 98 |
| | | <u>ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | |
| 0 | 2101 | වාහන | | | | |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 300 | 297.000 | 3 | 99 |
| 0 | 2103 | පැළෑටි, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 300 | 291.028 | 8.972 | 97 |
| 0 | 2104 | ගොඩනැගිලි සහ නිර්මාණ | 900 | 895.009 | 4.991 | 99 |
| 0 | 2105 | ඉඩම් සහ ඉඩම් වැඩි දියුණු කිරීම | 1,000 | 991.620 | 8.380 | 99 |
| | | <u>ප්‍රාග්ධන පැවරීම</u> | | | | |
| 0 | 2201 | උද්භිද උද්‍යාන භාරකාර අරමුදල | 40,000 | 39,999.999 | 0.001 | 100 |
| 0 | 2401 | පුහුණුව සහ ගොඩනැගීමේ ධාරිතාවය | 90 | 46.961 | 43.039 | 51 |
| | | <u>විශේෂ ව්‍යාපෘති</u> | | | | |
| 1 | 2502 | ගම්පහ උද්‍යානය සංවර්ධනය කිරීම | 7,000 | 6,937.543 | 62.457 | 99 |
| 1 | 2502 | ගනේවත්ත වන ඖෂධ උද්‍යානය | 5,750 | 5,682.874 | 67.126 | 98 |
| 2 | 2502 | මල්වගා සංවර්ධන වැඩසටහන | 37,000 | 36,330.695 | 669.305 | 98 |
| 3 | 2502 | වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට | 50,000 | 49,277.515 | 722.485 | 98 |
| 4 | 2502 | තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල | 6,800 | 6,746.502 | 53.498 | 99 |
| | | **එකතුව** | **150,590** | **148,924.87** | **1,664.13** | **98.** |

## 2.3.2.පුනරාවර්තන වැය

| විෂය මුලක කේතය | විෂය මුලක විස්තරය | 2010 වර්ෂයේහි අය - වැයෙහි ශුද්ධ ප්‍රතිපාදනය | මුළු වැය | ඉතිරි ප්‍රතිපාදන | % |
|---|---|---|---|---|---|
| | **පුද්ගල සංවේතන** | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 83,000,000.00 | 82,079,671.00 | 920,329.00 | 98.8 |
| 2002 | අතිකාල සහ නිවාඩු සඳහා ගෙවීම | 5,300,000.00 | 4,969,881.00 | 330,119.00 | 93.7 |
| 1003 | අනෙකුත් දීමනා | 34,928,000.00 | 32,557,941.00 | 2,370,059.00 | 93.2 |
| | **ප්‍රවාහන වියදම්** | | | | |
| 1101 | දේශිය | 1,000,000.00 | 988,888.00 | 11,112.00 | 98.8 |
| 1102 | විදේශිය | 100,000.00 | 70,086.00 | 29,914.00 | 70 |
| | **සැපයුම්** | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 600,000.00 | 596,278.00 | 3,722.00 | 99.3 |
| 1202 | ඉන්ධන | 1,900,000.00 | 1,699,628.00 | 200,372.00 | 89.4 |
| 1203 | ආහාර සහ නිළ ඇඳුම් | 150,000.00 | 141,749.00 | 8,251.00 | 94.4 |
| 1205 | අනෙකුත් දෑ | 2,300,000.00 | 2,094,172.00 | 205,828.00 | 91 |
| | **නඩත්තු වැය** | | | | |
| 1301 | වාහන | 1,000,000.00 | 988,240.00 | 11,760.00 | 98.8 |
| 1302 | පැළෑටි, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 300,000.00 | 298,367.00 | 1,633.00 | 99.4 |
| 1303 | ගොඩනැඟිලි සහ නිර්මාණ | 300,000.00 | 298,715.00 | 1,285.00 | 99.5 |
| | **සේවාවන්** | | | | |
| 1401 | ප්‍රවාහන | 700,000.00 | 698,390.00 | 1,610.00 | 99.7 |
| 1402 | තැපැල් සහ විදුලි සංදේශ | 1,300,000.00 | 1,215,698.00 | 84,302.00 | 93.5 |
| 1403 | විදුලිය සහ ජලය | 4,000,000.00 | 3,825,375.00 | 174,625.00 | 95.6 |
| 1404 | කුළී සහ දේශිය බදු | 600,000.00 | 596,817.00 | 3,183.00 | 99.4 |
| 1405 | අනෙකුත් සේවාවන් | 16,500,000.00 | 15,943,636.00 | 556,364.00 | 96.6 |
| | **සංක්‍රාම** | | | | |
| 1506 | දේපල ණය පොළිය | 750,000.00 | 715,135.00 | 34,865.00 | 95.3 |
| | එකතුව | **154,728,000.00** | **149,778,667.00** | **4,949,333.00** | 96.8 |

# 3. රාජකීය උද්භිද උද්‍යානය , පේරාදෙණිය


## 3.1 හැඳින්වීම

අශ්ව ලාඩමක හැඩයට වූ භූමි භාගයක පිහිටා ඇති පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය වටා ශ්‍රී ලංකාවේ දිගම ගඟ ලෙස සැලකෙන මහවැලි ගඟ ගලා බසී. මෙම උද්‍යානය මහනුවර නගරයේ සිට කිලෝමීටර් හයහමාරක් එපිට නිශ්චල මහනුවර කඳුකර ප්‍රදේශයේ පිහිටා ඇත. මෙහි මුළු වපසරිය අක්කර 147 (හෙක්ටයාර් 60 ක් පමණ ) වන අතර පැළ වර්ග 4,500ක් පමණ පවතී.

එමෙන්ම මෙම උද්‍යානය ශ්‍රී ලංකාවේ විශේෂ පැළ වර්ගයන් නිර්මාණය කරන විසිතුරු පැළෑටි සහ වැල් වර්ග විශාල ප්‍රමාණයක නිජබිම ද වන්නේ ය. ඇතට විහිදෙන තණබිම්වල සශ්‍රීක ලෙස අප රටට ආවේණික විශාල වෘක්ෂ වැඩී ඇති අයුරු දැක ගත හැකි අතර උද්‍යානයේ ස්ථාපිත ඕකිඩ් උද්‍යානයට ද සුවිශේෂී අවධානය යොමුවේ. මෙම උයන 300 කට අධික වූ විවිධ වර්ගයේ අත්‍යාලංකාර ඕකිඩ් මල්වලින් ගහන වේ. පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ යොදා ගනු ලබන ගස් වර්ග සහ පැළෑටි වර්ග කුළු බඩු උයන තුළ දක්නට ලැබේ. මෙම උද්‍යානය සමීපයෙන් ගලා බස්නා මහවැලි නදිය එම උද්‍යානයේ විචිත්‍රවත් බව තවදුරටත් ඔප් නංවයි.

## 3.2. පැළෑටි නිෂ්පාදනය

මෙම වසර තුළදී විශාල ප්‍රමාණයෙන් පැළෑටි, බිජ පැකට්ටු හා වෙනත් රෝපණ ද්‍රව්‍ය (වියළි මල්, උණ බම්බුවලින් සැදූ පෝච්චි , කුළු බඩු පත්‍ර.... සහ අමු මල්) නිෂ්පාදනය කරන ලදි. මීට අමතරව ගෙවතු පැළ 127,794 සහ බිජ කි.ග්‍රෑ 113.5 ක් රැස්කොට උද්‍යානයේ දැනට තිබෙන පැළෑටි එකතුව වැඩි කිරීම සඳහා යොදා ගන්නා ලදී.




## 3.3. ශාක විතැන් සංරක්ෂණය

උද්‍යානයේ දැනට පවතින පැළ එකතුව ඉහල දැමීම හා ශාක විතැන් සංරක්ෂණය (වගුව 5) සඳහා ක්‍රියාකාරකම් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර දිවයින පුරා විවිධ විහාරස්ථානවල නායක ස්වාමීන් වහන්සේලා විසින් සිදු කරන ලද ඉල්ලීම් ඉටු කරමින් ආගමික සහ ඓතිහාසික වශයෙන් වටිනාකමක් සහිත ගස් වර්ග 25කට වලට ප්‍රතිකාර කිරීම ද සිදු කරන ලදි.

**පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදි**

- රුක් උයනෙහි දේශිය වෘක්ෂ වර්ග අලුතෙන් සිටුවීම හා නැවත සිටුවීම
- රුක් උයනෙහි ආගන්තුක (විදේශිය) වෘක්ෂ අලුතෙන් සිටුවීම හා නැවත සිටුවීම
- වෘක්ෂවල පාදයේ හා කදේ තිබෙන කුහර සඳහා ප්‍රතිකාර කිරීම හා කරු, පොලු හා කේබල් වලින් ගස් වලට වන හානි වලින් ආරක්ෂා කිරීම
- රුක් උයනේ මැරුණු හා වැටුණු ගස් තාක්ෂණික පදනමක් යටතේ උද්‍යානයෙන් ඉවත් කිරීම
- පැළැටි ලේබල් කිරීම
- ශාක සැත්කම් කටයුතු සම්බන්ධ

## 3.4. අධ්‍යාපන හා පුහුණු

ඇන්තුරියම් , ඕකිඩ් , රෝස , විසිතුරු පත්‍ර ශාක, ජර්බෙරා වගාව හා ව්‍යාප්තිය පිළිබඳ පුද්ගලයන් 3058 දෙනෙකු පුහුණු කරන ලදි. එමෙන්ම තවාන් කලමනාකරණය, පැළැටි හඳුනා ගැනිම, ජෛව විවිධත්වය, ශාක සැත්කම්, මල් සැකසුම්, පසු අස්වනු තාක්ෂණය, උද්භිද උද්‍යාන, පටක රෝපණය ආදිය පිළිබඳව ද 2010 වර්ෂයේදි උද්‍යාන අලංකරණය මූලික කොට ගනිමින් පුද්ගලයන් 1088 දෙනෙකු පුහුණු කරන ලදි.

භූමි අලංකරණය හා මල් වගාව සම්බන්ධව දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් දහසය දෙනෙකු හට සහතික පත්‍ර ප්‍රදානය කරන ලදි.

## 3.5. යටිතල පහසුකම් සංවර්ධනය

- ප්‍රධාන පිවිසුම් මාර්ගය , ප්‍රධාන වටරවුම සහ රාජකීය පාම් ගස් සහිත මාර්ග කාපට් කිරිමේ කටයුතු අවසන් කොට ඇත. ගඟ අසබඩින් දිවෙන මාර්ගය තාර දැමීම හා අනෙකුත් අභ්‍යන්තර මාර්ග අලුත්වැඩියා කිරීමේ කටයුතු ද අවසන් කොට ඇත.
- පතොක් හා මාංසල ශාක ව්‍යාප්තිය සඳහා නව හරිතාගාරයක් ඉදි කරන ලදි.
- උද්‍යානය තුළ සියළු අංගෝපාංගයන්ගෙන් හෙබි වැසිකිළි සංකීර්ණයක් ඉදිවෙමින් පවතී.
- පැළ අලෙවිසැල හා ජාතික ශාකාගාරයේ දියුණුව සම්බන්ධයෙන් කටයුතු කිහිපයක් සිදු කරන ලදි. එල්ලෙන පාලම ද අලුත්වැඩියා කරන ලදි.
- ශ්‍රී මහා බෝධියේ අංකුර ව්‍යාප්ත කිරීම සඳහා යොදා ගත් හරිතාගාරය දියුණු තත්වයකට පත්කොට “ සරක ” කුටිය අලුත්වැඩියා කරන ලදි.



නව වැසිකිළි පද්ධතිය ඉදි කිරීම



නව පතොක් ගෘහය ගොඩනැගීම



"සරක" කුටිය අලුත්වැඩියා කිරීම



අභ්‍යන්තර මාර්ග කාපට් කිරීම

## 3.6. විශේෂ අවස්ථා

- 2010 නොවැම්බර් 25 වන දින උද්‍යානය නවීකරණය කිරීම.

- අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දෙවනවර දිවුරුම් දීමේ සමරු උළෙල සැමරීම වස් " දැයට සෙවන " වැඩසටහන යටතේ රාජකීය උද්භිද උද්‍යානයේ රුක් උයනේ පැළ 204 පැළ කරන ලදී. එසේම පැළ 105 මෙම වැඩසටහන යටතේ පැළ කිරීම සඳහා රාජ්‍ය ආයතන වෙත බෙදා හරින ලදී.





"දැයට සෙවන" වැඩසටහන යටතේ ගස් සිටුවීම

- ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා 2010 මැයි 01 දින රාජකීය උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන ලදි.

- ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා 2010 ජුලි 07 දින රාජකීය උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන ලදි.





# 4. මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

## 4.1. හැඳින්වීම



මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය, මල් වගා ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම සඳහා පිහිටුවන ලදි. එමෙන්ම, මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා පුහුණු වැඩසටහන්, ක්ෂේත්‍ර උපදේශක සේවා, දිස්ත්‍රික් මට්ටමෙන් මල් වැවීමේ සංවිධාන ස්ථාපිත කරමින් මෙම ක්ෂේත්‍රය සම්බන්ධ ආයෝජන අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම. ඒ සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය උපකරණ හා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ලබාදීම තුළින් මෙම ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා දායක කර ගැනීම ද මෙම ඒකකය පිහිටුවීමේ අරමුණු අතර වේ. ශ්‍රී ලංකාවේ මල්වගා ක්ෂේත්‍රය මෑත අතීතයේදී ලාභදායි විනිමය ඉපැයීම් ලබාදෙන මාර්ගයක් ලෙස ඉදිරියට පැමිණ ඇත. එහෙයින් ආදායම් උත්පාදනය හා රැකියා සැපයීම සඳහා මෙම ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

මල්වගා ක්ෂේත්‍රයේ නියැලෙන්නන් හට ඔවුන්ගේ සැබෑ විභවයන් හඳුනා ගනිමින් ඔවුන්ගේ අස්වනු, පරිසරය, ගම, නගරය, රට යන සියල්ලේ ම තිරසාර සංවර්ධනය තුළින් විශාල වශයෙන් ලාභ ලබා ගැනීම සඳහා මල් වගා පර්යේෂණ හා සංවර්ධන ඒකකය ඔවුන්ගේ සහයෝගය ලබාදෙයි.

## 4.2. මතු කර දක්වන පර්යේෂණ

පහත සඳහන් මාතෘකා පිළිබඳ පර්යේෂණ සිදු කරන ලදි.

1. ඇන්තූරියම් ඇන්ඩ්‍රීනියම් බෝ කිරීමේ දී සෛල ප්ලාස්ම විභාජනයේ බලපෑම.
2. ක්ලෝරොපීටම් ක්‍රෝමසම් ශාකවල පැළ ඇතිවීමේ සහ ශාකවල ගුණාත්මකභාවයෙහි සෛල ප්ලාස්ම විභාජනය සහ ඔක්සින් එකතුව බාහිරව යෙදූ විට ඇතිවන බලපෑම.
3. සජීවස්ථ ඇන්තූරියම් ඇන්ඩ්‍රියම් ශාකවල රිකිලි ඇතිවීමේදී සෛල ප්ලාස්ම විභාජනය සහ ගිබෙරෙලික් අම්ල එකතු වීමේ බලපෑම
4. RAPD විශ්ලේෂණය යොදා ගනිමින් සංයුක්ත ඉ. ට්‍රයිනර්වියම් වර්ගීකරණ තත්ත්වය පැහැදිලි කර ගැනීම සහ එක්රැස් කිරීම බීජාංකුර ප්‍රරෝහණයේදී බීජ්පී බලපෑම මෙන්ම ජානමය විචල්‍යතාව.
5. ඩ්‍රසීනා ගොඩස්ෆිනා ශාක සඳහා සුදුසු රෝපිත මාධ්‍යය සහ පොහොර සංයෝගය.
6. මහනුවර දිස්ත්‍රික්කයේ තෝරා ගනු ලැබූ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ඇන්තූරියම් වවන්නන් විසින් ප්‍රයෝජනයට ගනු ලබන ව්‍යාප්ත සේවාවල සඵලතාවය.

7. Cordyline terminalis ශාක වල කැපූ පත්‍ර නෙළාගත් පසු එහි පෝච්චිගත ආයුකාලය දීර්ඝ කිරීම සඳහා ගිල්වා තැබීමට සුදුසු ද්‍රාවණය තීරණය කිරීම.

8. *Zamioculcus zaminae* ශාකවල කඳ සහ පත්‍රවල කුණුවීම සිදු කරන රෝගකාරකය බැක්ටීරියාවක් ලෙස තහවුරු කරන ලදී.

9. චීන තෘණ සහ mondo තෘණවල (*Ophiopogan intermedius)* ශාකවල පැළ ඇතිවීම , පත්‍රවල දිග සහ ප්‍රමාණවල සෛල ප්ලාස්ම විභාජනයේද සහ ඔක්සින්වල බලපෑම

10. ජර්බේරා ක්ෂුද්‍ර ප්‍රචාරණය

## 4.3. සමීක්ෂණ

අධ්‍යාන ව්‍යාපෘති වශයෙන් පහත සඳහන් සමීක්ෂණ මල් වගා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සිදු කරන ලදි.

1. මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රදේශවල මල් වගා කර්මාන්තය පිළිබඳ සමීක්ෂණය - අංකුඹුර, අලවතුගොඩ, මහනුවර මහනගර සභාව, පේරාදෙණිය, ගම්පොල, කඩුගන්නාව, ඒදඬුවාව, ගඟවටකෝරළේ හා කටුගස්තොට.

2. මහනුවර මල්වගා ක්ෂේත්‍රය පිළිබඳ සමීක්ෂණය - මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ පැල තවාන් හා මල් අලෙවිසැල්.

3. ගම්පහ දිස්තික්කයේ මල් වගා ක්ෂේත්‍රය පිළිබඳ සමීක්ෂණය - අපනයන පැළ තවාන් හා පැළ අලෙවි සැල්.

## 4.4. ප්‍රකාශන

### 4.4.1. පර්යේෂණ

1. රයිසෝබැක්ටිරියා බලපෑම ප්‍රවර්ධනය කරන ශාකවල වර්ධනයෙහි biofilm සැකසිමෙහි වැදගත්කම. මහේෂ්වරි ඩී.කේ. , ශාක වර්ධනය සහ සෞඛ්‍යය ප්‍රවර්ධන බැක්ටීරියාව - ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක නිබන්ධය 18, ස්ප්‍රින්ගර් - වර්ලැග් , බෙලින් ,හෙයිල්ඩල්බර්ස් පිටු 81-96.
   සෙනෙවිරත්න ජී, වීරසේකර එම්.එල්.එම්.ඒ.ඩබ්, සෙනෙවිරත්න කේ.ඒ.සී.එන්. , සවාහිර් ජේ.එස්, කෙක්ස් එම්.එල්, කෙනඩි අයි.ආර්.

2. 2010 දෙසැම්බර් මස 15 දින රුහුණු විශ්ව විද්‍යාලයේ පැවැත්වූ හත්වැනි විද්‍යා සම්මන්ත්‍රනයේ ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවට ආවේණික වූ ඔසු පැළයක් වන එක්සුකම් ට්‍රයිනර්වියම් ශාකවල බීජ ප්‍රරෝහණය සහ පැළෑටිවල ශක්තිය කෙරෙහි, පූර්ව ප්‍රරෝහණය BAP ප්‍රතිකාරයේ බලපෑම පිළිබඳ නිබන්ධනය. විතානගේ ඩී.එස්. දිසානායක . එන්.පී. , දයානන්ද ටී.ජී, ක්‍රිෂ්ණරාජා එස්.ඒ. සහ රුබසිංහ එම්.කේ.

3. 2010 දෙසැම්බර් මස 15 දින රුහුණු විශ්ව විද්‍යාලයේ පැවැත් වූ හත් වැනි විද්‍යා සම්මන්ත්‍රණයේ ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවේ එක්සුකම් ට්‍රයිනර්වියම් එකතුවේ ජානමය විවිධත්වය පිළිබඳ නිබන්ධනය. විතානගේ ඩී.එස්. , දයානන්ද ටී.ජී. , දිසානායක එන්.පී., ක්‍රිෂ්ණරාජා එස්.ඒ සහ රුබසිංහ එම්.කේ.

### 4.4.2. අනෙකුත් ප්‍රකාශන

එකක් පිටපත් දහසක් බැගින් පුවත්ලිපි 02 ක් නොමිලේ බෙදා හැරීම සඳහා ද පත්‍රිකා වර්ග සහයකට අයත් අත්පත්‍රිකා පිටපත් දහසක් බැගින් විකිණීම සඳහා ද මුද්‍රණය කරන ලදී.

කැට්ලියා වගාව පිළිබඳ ලිපියක් “ ලංකාදීප “ පත්‍රයේ පල කරන ලදී.





## 4.5. බෝ කිරීම (ඕකිඩ් සහ දේශිය පැළෑටි)

- ඕකිඩ් වර්ග සහ දේශිය ශාක රෝපණය කිරීම. ඩෙන්ඩ්‍රෝබියම්, වැන්ඩා, රයානෝස්ටිලිස්, කැටලියා සහ විශාල ඕකිඩ් වර්ගවලට අයත් දෙමුහුන් ඕකිඩ් වර්ග 48 ක් ඇති කර ඒවායේ බීජවලින් පැළෑටි ඇති කරන ලදී.

- විරිටා ශාකයේ වර්ග කිපයක් ඒකාබද්ධ කර දෙමුහුන් වර්ග 09 ක් ඇති කරන ලදි. ඇක්‍රොට්‍රීමා වෝල්කර මල් රාක්ක ගත කරන ලදි. එක්ස්‍යුකම් ට්‍රයිනර්වියම් , ඉ. ඇෆින් , විරිටා මුනි, ඇක්‍රොරීමා වොල්කරි සහ වීරිටා වෝල්කරි , විරිටා එස්පීපී වැනි ශාක ඒකාබද්ධ කොට ලබාගත් විරීටා ශාකයක් (සුදු පැහැති මල් සහිත) වැනි ශාකවල බීජවලින් පැළෑටි ඇති කරන ලදී. ඒවායින් ඉ.ඇෆින් ................පැළ 100ක්, ඉ, ට්‍රයිනර්වියම් පැළ 55 ක් විරිටා පැළ 35 ක් ආක්‍රොට්‍රිමා වොල්කරි පැළ 50 ක් ලබා ගන්නා ලදී.

- විරීටා මුනි විරීටා සෙයිලානිකා , විරීටා වොල්කරී ක්‍රෙන්ඩ්‍රිකියා වෝල්කරි, ලයිකොපොඩියම් වැනි ශාකවලින් පැළ ඇති කළ අතර සී. මුනි සී. සෙයිලානිකා සහ සී. සෙයිලානිකා එක්ස්.සී, වෝල්කරි වැනි ශාකවල කඳ යා කොට අළුත් දෙමුහුන් ඇති කරන ලදි.

- සී. සෙයිලානිකා සහ විරිටා එස්. වැනි ශාකවල එකතුවෙන් බීජ පැළ ගන්වනු ලැබු අතර ඒවායේ සුදු පැහැති මල් පිපෙන ලදී. එයින් නව දෙමුහුන් වර්ගයක් ඇති කරනු ලැබු අතර එය ඇගැයිමට භාජණය කොට ඇත.

## 4.6. පැළ නිෂ්පාදනය

| බෝගය | පැල සංඛ්‍යාව |
|---|---|
| ඕකිඩ් (බීජ රෝපණය හා මෙරික්ලෝන්) | **50,522** |
| ඇන්තූරියම් බීජාංකුර | **9750** |
| පටක රෝපිත ඇන්තූරියම් පැළෑටි | **7320** |
| විසිතුරු පත්‍ර ශාක | **38,765** |
| ජලජ ශාක | **275** |
| පර්බේරා | **2123** |
| වෙනත් පටක රෝපිත ශාක | **258** |
| පැළ නිෂ්පාදනයේ එකතුව | 109,043 |

## 4.7. අනෙකුත් උද්භිද උද්‍යාන සම්බන්ධ මල් වගා සංවර්ධන වැඩසටහන්

### 4.7.1.ගම්පහ උද්භිද උද්‍යානය

ඇන්තූරියම් හා ඕකිඩ් (Dendrobium) ශාක ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා මාධ්‍යය හා අනුමාධ්‍ය නිෂ්පාදන කරන ලදි. මීවන, ජර්බේරා හා ජලජ ශාක සම්බන්ධයෙන් සාමාන්‍ය නඩත්තු කිරීම් සිදු කරන ලදි. රසායනාගාරයෙන් නිකුත් කරන ලද බිජ රෝපිත ඕකිඩ් පැළ සිටුවනු ලැබූ පෝච්චි 327 ක් සකස් කරන ලද අතර ඉන් පෝච්චි 109 ක් හා 2 " ප්‍රමාණයේ ඒකල පෝච්චි 75 ක් ද අලෙවි විය. ජර්බේරා ශාක පැළෑටි 339 ක් ද එළවළු වශයෙන් ප්‍රචාරණය කරන ලද පැළෑටි නිෂ්පාදනය කරන ලදි. (එනම් පිළිවෙලින් 175 හා 164 ලෙස ය.)

උද්භිද උද්‍යානවල ජෛව විවිධත්වය හා ක්‍රියාකාරකම් සම්බන්ධ අධ්‍යාපන වැඩසටහන් ගුරු භවතුන් 40 ක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 602 ක් සඳහා පැවැත්වන ලදී. ජර්බේරා , ඇන්තූරියම්, ඕකිඩ් හා විසිතුරු පත්‍ර ශාක වගා කිරිම සඳහා පිළිවෙලින් පුද්ගලයින් 40,385,297 හා 152 ක් සඳහා පුහුණු කිරීම් සිදු කෙරින. පාසැල් ව්‍යාපෘති 06 ක් සඳහා ද ඕකිඩ් වගාව පිළිබඳ තොරතුරු ලබාදෙන ලදී.

මල් පැල සඳහා බලපාන කෘමින් 10 ක් රෝග 10 ක් පිළිබඳ නිදර්ශක රැස් කරන ලදී.

### 4.7.2. වියළි කලාපීය උද්භිද උද්‍යානය, හම්බන්තොට

ඕකිඩ් , ඇන්තූරියම් හා විසිතුරු පැළෑටි එකතුව නඩත්තු කරන ලදි. පැළ 97 දැනට පවත්නා පැළ එකතුවට එක් කරන ලදි (ඕකිඩ් 32, පතොක් 04, ඇන්තූරියම් 20, විසිතුරු පැළෑටි හා විසිතුරු පත්‍ර ශාක 41) පැළ තවාන්වලදී විසිතුරු පත්‍ර ශාක 100 ක් ප්‍රචාරණය කරන ලදි.

විවිධ වර්ගයන්ට අයත් ඕකිඩ් 5100 ප්‍රචාරණය හා අභිජනන කටයුතු සඳහා තායිලන්තයේ " කුල්තානා ඕකිඩ් " වලින් ආනයනය කරන ලදි. ( ඩෙන්ඩ්‍රෝබියම් වර්ග 81 ක පැළ 3000, කැටලීයා වර්ග 42 ක දෙමුහුම් ශාක 1000, මොකරා වර්ග 21 ක දෙමුහුම් ශාක 500, වැන්ඩා සහ ඇකොසෙන්ඩා වර්ග 36 ක පැළ 600 ක් වශයෙනි.)

ඇන්තූරියම් සිටුවීම සඳහා පාත්ති සකස් කිරිමට සැලසුම් ඉදිරිපත් කරන ලද අතර, ඇන්තූරියම් පැළ 2000 ක් මිලදී ගෙන පාත්ති සකස් කරන තුරු ඒවා පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ඇන්තූරියම් තවානේ සිටුවා නඩත්තු කරන ලදි.

පේරාදෙණිය උද්‍යානයේ නිෂ්පාදිත ඕකිඩ් 1200 ක් සඳහා නව හරිතාගාර සකස් කරන ලදි. ඇන්තූරියම් මිලදී ගැනිමේදී හා පාත්ති වල සිටුවිමේ කටයුතු සඳහා මෙන්ම ඕකිඩ් පැළ පෝච්චිවල සිටුවීම සඳහා ද අවශ්‍ය දායකත්වය සපයන ලදි. ඕකිඩ් හා ඇන්තූරියම් වගාව පිළිබඳව උද්‍යාන නිලධාරින් හා සේවක පිරිස පුහුණු කරන ලදි.

### 4.7.3. හක්ගල උද්භිද උද්‍යානය

ඉන්දියාවේ මුම්බායි නගරයෙන් ගෙන්වන ලද "කේ.එෆ්. ජෛව ශාක" වලින් යුත් ලිමෝනියම් පැළ 300 ක් උද්‍යානයෙන් ඉවත් කර අලෙවි කිරිම හා මල් වවන්නන් වෙත බෙදා දිම සඳහා හක්ගල උද්භිද උද්‍යානය වෙත යවන ලදි.

### 4.7.4. තෙත් කලාපීය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

නව මල් වගා පර්යේෂණ, අධ්‍යාපන හා පුහුණු පහසුකම් ස්ථාපිත කිරිම සඳහා ජාත්‍යන්තර කොරියානු ඒජන්සිය( KOICA ) ආධාර යටතේ ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදි.

පේරාදෙණිය උද්‍යානයේ නිෂ්පාදිත ඕකිඩ් 1200 ක් සඳහා නව හරිතාගාර සකස් කරන ලදි. ඇන්තූරියම් මිලදී ගැනිමේදී හා පාත්තිවල සිටුවිමේ කටයුතු සඳහා මෙන්ම ඕකිඩ් පැළ පෝච්චිවල සිටුවීම සඳහා ද අවශ්‍ය දායකත්වය සපයන ලදි. ඕකිඩ් හා ඇන්තූරියම් වගාව පිළිබඳව උද්‍යාන නිලධාරින් හා සේවක පිරිස පුහුණු කරන ලදි.

## 4.8. අධ්‍යාපන හා පුහුණු

| විෂය | කාල සීමාව | පංති දේශක සංඛ්‍යාව | සහභාගිවූවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ඕකිඩ් වගාව | දවස් 01 | 30 | **873** |
| | ප්‍රායෝගික පුහුණුව | 20 | **70** |
| විසිතුරු පත්‍ර | දවස් 01 | 39 | **1613** |
| | ප්‍රායෝගික පුහුණුව | 15 | **50** |
| ඇන්තූරියම් | දවස් 01 | 53 | **2115** |
| | ප්‍රායෝගික පුහුණුව | 35 | **169** |
| ජර්බේරා වගාව | දවස් 01 | 11 | **258** |
| පටක රෝපණය | දවස් 05 | 09 | **55** |
| අනෙකුත් වැඩසටහන් | දවස් 01 | 12 | **431** |
| එකතුව | | 224 | 5634 |

වවුනියාව ප්‍රදේශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 110 දෙනෙකු සඳහා පටක රෝපණය පිළිබඳව දේශන මාලාවක් පවත්වන ලදි. (එනම් උතුරු අධ්‍යාපන කලාපයේ සිසු සිසුවියන් සඳහා )

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පොළොන්නරුව අන්තර් පළාත් පුහුණු මධ්‍යස්ථානයේදී මල් වවන්නන් 27 ක් සඳහා ඇන්තූරියම් වගාව පිළිබඳව පුහුණු වැඩසටහනක් පවත්වන ලදි .

රත්නපුර රජවක පුහුණු මධ්‍යස්ථානයේදී “ වටිනාකම එකතු කළ ශාක'' පිළිබඳ ප්‍රායෝගික මෙන්ම සිද්ධාන්තමය දේශන ඇතුලත් වැඩමුළුවක් පැවැත්වන ලදී.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 15 දෙනෙකු සඳහා ‘ “බොන්සායි ’' කලාව පිළිබඳව දේශන මාලාවක් පවත්වන ලදි.

රජවක සේවා සංස්කරණ පුහුණු ආයතනයේ අ.පො.ස (උ.පෙළ) සිසු සිසුවියන් සඳහා ඕකිඩ් හා ඇන්තූරියම් වගාව පිළිබඳ දේශන පවත්වන ලදි.

ඇන්තූරියම් වගාව පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන් පෙළක් පුද්ගලයන් 52 කු සඳහා ඇල්කඩුව වතුයායේදී දෙමළ මාධ්‍යයෙන් පවත්වන ලදි. කෘෂිකර්ම විද්‍යාලයේ සිසු සිසුවියන් 57 ක් සඳහා ඕකිඩ්, ඇන්තූරියම් , රෝස වගාව පිළිබඳව මෙන්ම භූමි අලංකරනය පිළිබඳව ද දෙමළ භාෂාවෙන් පවත්වන ලදී.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සිසු සිසුවියන් 200 කට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා ඇන්තූරියම්, ඕකිඩ් හා විසිතුරු පත්‍ර ශාක වගාව පිළිබඳ ප්‍රායෝගික දේශන මාලාවක් පවත්වන ලදී.

මල් වගාව සඳහා පටක රෝපණය භාවිත කිරීම පිළිබඳ දේශනයන් හා පටක හා අනුකූලනය ආරම්භ කිරීම පිළිබඳව ප්‍රායෝගික දේශන මාලා 02 ක් ද පටක රෝපණය පිළිබඳ වැඩමුළුව තුළදී පුද්ගලයන් 12 දෙනෙකු සඳහා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී පවත්වන ලදී.

## 4.9. උපදේශනාත්මක සේවා

වාරියපොල කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේ පටක රෝපණ ඒකකය මෙන්ම තලවතුගොඩ, කිරිබත්ගොඩ පිහිටි මල් වගාකරුවන් තුන්දෙනෙකුගේ පැළ තවාන් ද නිරීක්ෂණය කොට උපදෙස් දෙන ලදි.

අපනයන කෘෂිකර්ම මණ්ඩලය විසින් ඒකාබද්ධ කෘෂිකර්ම ආදර්ශන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ මුලාරම්භක පියවර වශයෙන් පානදුර පිහිටි රුවිනි හරිත පැළ තවාන නිරීක්ෂණය කරන ලදි. ගම්පහ පිහිටි " හරිත ''පැළ තවාන ද නිරීක්ෂණය කොට උපදෙස් ලබාදෙන ලදි.

වාණිජ මල් වගාව, තවාන් කළමනාකරණය, කෘමි හා රෝග කළමනාකරණය මෙන්ම බාහිර ප්‍රචාරණය යන කරුණු පිළිබඳ උපදේශන සේවා පුද්ගලයන් 580 දෙනෙකු හට නොමිලේ ලබාදෙනු ලැබීය. එහිදී මෙම ඒකකය වෙත පැමිණ හෝ තැපැල් මාර්ගයෙන් එම තොරතුරු ලබා ගැනීමට පහසුකම් සලසා තිබුනි.

## 4.10. "සුවහස් මල් " වැඩසටහන

මල් වගා ක්ෂේත්‍රයේ නියැළි සුළු හා මධ්‍ය පරිමාන මල් වගාකරුවන්ගේ ආර්ථික තත්වයන් ඉහල දැමීම සඳහා 2005 වසරේදි දියත් කල " සුවහස් මල් ''වැඩසටහන මල්වගාකරුවන්ට ප්‍රතිලාභ අත්කර දුන් පහත ක්‍රියාකාරකම් සමග මෙම වසරේදි ද ක්‍රියාත්මක විය.

මෙම මල් සමාජවල රැස්වීම් 400 කට වඩා මෙම ඒකකයේ නිලධාරීන් සහභාගි වී ඇත.

සුවහස් මල් සමාජ වල අසූ තුනක් පුත්තලම, මහනුවර, මාතලේ, ගම්පහ, කෑගල්ල, නුවරඑළිය, කළුතර, ඌව හා කොළඹ ප්‍රදේශ පාදක කොට ගෙන ක්‍රියාත්මක වේ. මෙම වසරේදි මාතලේ දිස්ත්‍රික්කයේ බදරාපොල ප්‍රදේශයේද එවැනි එක් සමාජයක් පිහිටුවා ඇත.

### 4.10.1. මල් වගාකරුවන්ගේ ශක්‍යතාව වැඩි දියුණු කිරිම සඳහා වැඩසටහන්

අලෙවි කටයුතු වැඩි කිරිම සඳහා මෙන්ම මල්වගාකරුවන්ගේ ශක්‍යතාවය වැඩි කිරිම සඳහාත් දිවයින පුරා ප්‍රදර්ශන, පැල අලෙවි කටයුතු, පුහුණු වැඩමුළු සංවිධානය කරන ලදි. එමෙන්ම මෙම වැඩසටහන යටතේ මල් වගාකරුවන්ගේ පැල තවාන නිරීක්ෂණය කල අතර උපදෙස් ද ලබාදෙන ලදි.

## අ. පැළ අලෙවිය සහ ප්‍රදර්ශනය සහ පැළ අලෙවිය

| දිස්ත්‍රික්කය | විශාල දිස්ත්‍රික් මට්ටම | කුඩා දේශිය |
|---|---|---|
| ගම්පහ | 04 | 60 |
| මහනුවර | 01 | 02 |
| මාතලේ | 03 | 01 |
| කෑගල්ල | 01 | 16 |
| හම්බන්තොට | 02 | - |
| පුත්තලම | 01 | 06 |
| බණ්ඩාරවෙල බලංගොඩ | - | 01 |
| කළුතර | 02 | 02 |
| එකතුව | 14 | 88 |



## ආ. වැඩමුළු

| දිස්ත්‍රික්ක | වැඩමුළු ගණන | සහභාගිවූවන්ගේ ප්‍රමාණය |
|---|---|---|
| ගම්පහ | 06 | 365 |
| මහනුවර | 01 | 75 |
| මාතලේ | 01 | 50 |
| පුත්තලම | 05 | 70 |
| කෑගල්ල | 20 | 324 |
| හම්බන්තොට | 13 | 225 |
| නුවරඑළිය | 05 | 128 |
| එකතුව | 51 | 1237 |



## ඇ. නැරඹීමට ගිය පැළ තවාන්

| දිස්ත්‍රික්ක | පැළ තවාන් ප්‍රමාණය |
|---|---|
| ගම්පහ | 354 |
| මහනුවර | 02 |
| මාතලේ | 16 |
| පුත්තලම | 33 |
| කෑගල්ල | 111 |
| හම්බන්තොට | 31 |
| නුවරඑළිය | 40 |
| එකතුව | 587 |



**(ඇ). අනෙකුත් වැඩසටහන්**

**පුත්තලම දිස්ත්‍රික්කය**

සුවහස් මල් වගාකරුවන්ගේ නිෂ්පාදන අලෙවි කිරිමට උරදීම සඳහා එම සංවිධාන අපනයනකරුවන් සමග සම්බන්ධ කොට ඇත. කොන්ත්‍රාත් පදනම යටතේ අපනයනකරුවන් සඳහා පැළ 6988 ක් නිෂ්පාදනය කොට ඇති අතර මල් වගාකරුවන්ට රු 112,545.00 ක මුදලක් උපයා ගැනිමට හැකි වි ඇත.

**ගම්පහ, කෑගල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක**

විවිධ ප්‍රදේශවල පිහිටි පැළ තවාන් නැරඹිම සඳහා ඉහත ප්‍රදේශවල “ සුවහස් මල්” වගාකරුවන් හට ක්ෂේත්‍ර සංචාර ලබාදෙන ලදි.

ගම්පහ හම්බන්තොට සහ කෑගල්ල දිස්ත්‍රික්කවල “ සුවහස් මල්” සමාජවල මල්වගාකරුවන්ගේ සහාභාගිත්වයෙන් පිළිවෙලින් 2,3 හා 13 වශයෙන් ක්ෂේත්‍ර සංචාර සිදු කරන ලදි.

## 4.11. මෙම ඒකකයේ අනෙකුත් ක්‍රියාකාරකම්

2010 වර්ෂයේ ජනවාරි 07 - 09 දක්වා චිනයේ කුන්මින්ග් හි පැවැති ආසියානු මල් වගාව පිළිබඳ කලාපීය විශේෂඥ උපදේශනය සඳහා සහාභාගිත්වය ලබාදෙන ලද අතර ශ්‍රී ලංකාවේ මල් වගාවේ තත්ත්වය පිළිබඳ ලේඛනයක් ද ඉදිරිපත් කරන ලදි.

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ “ බිංගිරිය කෘෂි අපනයන ග්‍රාම ” ව්‍යාපෘතිය යටතේ ඉදි කරනු ලැබූ සෙවන ලබාදෙන ගෘහ සියය ඇන්තූරියම් සහ පත්‍ර ශාක වර්ධනය සඳහා යෝග්‍ය ද යන්න පරික්ෂා කරනු ලැබී ය.

“ බිංගිරිය කෘෂි අපනයන ග්‍රාම ” ව්‍යාපෘතියට දායක වීමට සුදුසු පුද්ගලයින් තෝරා ගැනීම සඳහා ග්‍රාම සේවා කොට්ඨාශ 31 කට අයත් ස්ථාන 183 ක් පරීක්ෂා කොට එයින් 57 දෙනෙකු සුදුසු යැයි තෝරා ගන්නා ලදි. තවද ඇන්තූරියම් මල් පෝච්චි සැදීම පිළිබඳව පුද්ගලයින් 70 දෙනෙකුට පුහුණුව ලබාදෙන ලදි.



ඕකිඩ් පැල තවානේහි අහල් “ 2 ” පෝච්චි සහිත වීදුරු ගෘහය අලුත්වැඩියා කරන ලදි.

# 5. ජාතික ශාකාගාරය

## 5.1. හැඳින්වීම

ජාතික ශාකාගාරය යනු ශ්‍රී ලංකාවේ ශාකවල වියළි ශාකාගාර නිදර්ශක එක් රැස් කර ඇති ස්ථානයකි. විදේශිය වෙනත් බහුල නිදර්ශක සහ වගා කරන ලද නිදර්ශක ක්‍රමානුකූල අධ්‍යයනය සඳහා ආරක්ෂා කර ඇත.



මනා තත්වයේ 148,000 ශාකාගාර නිදර්ශක විමර්ශනය සඳහා තබා ඇත. 3500 ක් පමණ ග්‍රන්ථ සහ සෙසු ශාක හා සම්බන්ධ වූ පුවත්පත්, සඟරා පුස්තකාලයේ විමර්ශනය සඳහා තබා ඇත.

ජාතික ශාකාගාරය ශාක ගවේෂණය, නිදර්ශක හඳුනා ගැනිම සහ සැකසීම මෙන්ම තොරතුරු රැස් කිරීම, වර්ග කිරීම සහ ව්‍යාප්තිය ද දේශිය ශාකයන්ගේ අගනාකම ප්‍රතිශෝධනය පිළිබඳව සක්‍රිය දායකත්වයක් ලබාදෙයි.

ජාතික ශාකාගාරය දේශිය සහ විදේශිය පර්යේෂකයින් සඳහා වර්ගීකරණ පර්යේෂණ හා සම්බන්ධ පර්යේෂණ කාර්යයන් සඳහා පහසුකම් සලසනු ලබයි. එසේම ජාතික ශාක නිරෝධායතනය සහ රේගුව වෙත ශාක හා සම්බන්ධ නෛතික ගැටළු පැනු නැගුණ විට සහ ශාක ද්‍රව්‍යය ආනයනයේදි හා අපනයනයේදී නෛතික ගැටළු පැන නැගුණු විට ශාක හඳුනා ගැනීම සඳහා සේවය ලබා දෙයි. මෑතකදී ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳව ජාතික රතු දත්ත නාමාවළිය අධිකාරිය වශයෙන් ද ජාතික ශාකාගාරය පිළිගන්නා ලදි. ජාතික ශාකාගාරය සහ ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල පිහිටි පර්යේෂණ ආයතන සමග ශාක නිදර්ශක සහ දැනුම හුවමාරු කර ගැනීමේ කර්තවයේ නියැලි සිටියි.

## 5.2. පැළෑටි ගවේෂණය සහ මල් වගා පර්යේෂණ

### 5.2.1 ක්ෂේත්‍ර ගවේෂණය

පහත සඳහන් ක්ෂේත්‍ර ගවේෂණයක් සිදු කර සහ පැළෑටි එක් රැස් කිරීම් කොට නිදර්ශක හඳුනාගෙන ඒවා සත්‍යාපනය කර කදාවන් සාදා ජාතික ශාකාගාරයේ සහ අනෙකුත් උද්‍යානවල පිහිටි එහි ශාඛාවල තිබෙන නිදර්ශක එකතුවට එකතු කරන ලදී.

.

| ස්ථානය | ක්ෂේත්‍ර ගවේෂණ වල සංඛ්‍යාව | එකතු කරන ලද නිදර්ශක | | |
|---|---|---|---|---|
| | | බීජ ශාක | පාසි ශාක | මී වන |
| හක්ගල උද්භිද උද්‍යානය | 02 | _ | 83 | - |
| කෝබට්ස් කපොල්ල, නකල්ස් | 01 | 25 | 30 | - |
| වැඋඩකන්ද වන සංචිතය | 01 | 44 | 30 | 05 |
| දෙලොස්බාගේ - රාක්ෂාව | 01 | 20 | 61 | |
| කිතුල්ගල වන රක්ෂිතය | 01 | 50 | 49 | 10 |



### 5.2.2. හඳුනා ගැනීම සහ වැඩි දියුණු කිරීම

| වර්ග එකතුව | මූලාශ්‍රය | නිදර්ශක / කදාවන් සංඛ්‍යාව | | වැඩිදියුණු කිරීම |
|---|---|---|---|---|
| | | සකසන ලද | නිවැරදි බව තහවුරු කර එකතු කිරීම | |
| **බීජ ශාක** | කිතුල්ගල, නකල්ස්, කැලෑ බොක්ක, ලුල්කඳුර, ශ්‍රී පාදය, හුන්නස්ගිරිය යන ප්‍රදේශවල ක්ෂේත්‍ර ගවේෂණය | 148 | 148 | එන්එච් - පීඩීඒ |
| | ආචාර්ය උපාධිධාරි ශිෂ්‍ය Suman Neupane ගේ ශාක එකතුව | 82 | 82 | එන්එච් - පීඩීඒ |
| | ආචාර්ය එම්. ජයසූරිය මහතාගේ කන්නෙලිය සහ සිංහරාජය පිළිබඳ ශාක එකතුව | 286 | 420 | එන්එච් - පීඩීඒ |
| | ආචාර්ය සිංහකුමාර මහතාගේ ශාක එකතුව | | 206 | එන්එච් - පීඩීඒ |
| | මහාචාර්ය එස්.ගුණතිලක මහතාගේ ශාක එකතුව | | 1330 | එන්එච් - පීඩීඒ |
| | එම්.එම්.ඩී.ජේ. සේනාරත්න මහතාගේ ශාක එකතුව | | 155 | එන්එච් - පීඩීඒ |

| වර්ග එකතුව | මුලාශ්‍රය | නිදර්ශක / කදාවන් සංඛ්‍යාව | | වැඩිදියුණු කිරීම |
|---|---|---|---|---|
| | | සකසන ලද | නිවැරදි බව තහවුරු කර එකතු කිරීම | |
| | ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර මහතාගේ ශාක එකතුව සහ සී.ජයසිංහ මහතාගේ නිල්ගල ප්‍රදේශයේ ශාක එකතුව | | 28 | එන්එච් - පීඩීජ් |
| | එස්. ප්‍රනාන්දු මහතාගේ ශාක එකතුව | 05 | 05 | එන්එච් - පීඩීජ් |
| | වවුචර් නිදර්ශක වශයෙන් තැන්පත් | 24 | 24 | එන්එච් - පීඩීජ් |
| | ශාක ව්‍යාපෘතිය | | 445 | එන්එච් - පීඩීජ් |
| <u>පාසි ශාක</u> | හක්ගල ගවේෂණයේ ශාක එකතුව | 105 | 35<br>70 | එන්එච් - පීඩීජ්<br>හක්ගල |
| | රංගල කෝබට්ස් කපොල්ල ප්‍රදේශයේ ශාක එකතුව | 23 | 23 | එන්එච් - පීඩීජ් |
| | අඹගමුව ගවේෂණයේ ශාක එකතුව | 48 | 48 | එන්එච් - පීඩීජ් |
| | දොලොස්බාගේ - රාක්ෂාව ප්‍රදේශයේ ශාක එකතුව | 50 | 50 | එන්එච් - පීඩීජ් |
| | හුන්නස්ගිරිය ගවේෂණයේ ශාක එකතුව | 45 | 45 | එන්එච් - පීඩීජ් |
| <u>මී වන ශාක</u> | මීවන ශාක ව්‍යාපෘතිය | | 965 | එන්එච් - පීඩීජ් |
| | මහාචාර්ය එස්.ගුණතිලක මහතාගේ ශාක එකතුව | | 59 | එන්එච් - පීඩීජ් |

## 5.3. උද්භිද තොරතුරු සත්‍ය බව සහතික කිරීම සහ ව්‍යාප්ත කිරීම

මහජනතාවට , සිසුන්හට සහ රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවලට ඔවුන්ගේ ඉල්ලීම පරිදි නිවැරදි උද්භිද තොරතුරු ලබාදෙන ලදි.

### 5.3.1. නරඹන්නන්හට ලබාදෙන ලද තොරතුරු

- ආනයනය බලපත්‍ර ලබාදීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිරෝධායන අංශයට නිදර්ශක 17 ක් සම්බන්ධයෙන් ශාක තොරතුරු ලබාදෙන ලදි.
- මහජනතාවගේ ඉල්ලීම පරිදි බීජ ශාක 1511 සහ පාසි ශාක 366 හඳුනාගෙන සහතික කරන ලදී.
- පාසැල් සිසුන් 179 සහ විශ්ව විද්‍යාල සිසුන් 370 සහ අනෙකුත් ආයනවලින් 349 ක් ශාකාගාරය නැරඹීමට පැමිණ අවශ්‍ය තොරතුරු ලබා ගත්හ.

### 5.3.2. දත්ත සංචිතය සැකසීම

ශාක කුල 70 කට අයත් 3291 ලියාපදිංචිය සහිත පාසි ශාක සඳහා වු වවුචර් නිදර්ශක උපයෝගි කර ගනිමින් දත්ත සංචිතය සකස් කරන ලදි. නිදර්ශක 1400 සහ ශ්‍රී ලංකාවට ආවේණික වු ශාක වර්ග පහක් පිළිබඳව ජීවර්තු විද්‍යා පර්යේෂණය ද රාජකීය උද්භිද උද්‍යානයේ ලියාපදිංචි.

### 5.3.3. ජාතික රතු දත්ත නාමාවලිය ව්‍යාපෘතිය

ජාතික රතු දත්ත නාමාවලිය ව්‍යාපෘතිය ජාතික සහ ජාත්‍යන්තර වශයෙනුත් වඳ වී යාමේ අවධානමට ලක්වී ඇති ශාක පිළිබඳව ජාතික රතු දත්ත ග්‍රන්ථය සකස් කිරීමට අවශ්‍ය නිදර්ශක ඇගැයීම් සහ තොරතුරු එක්රැස් කිරීම පහත සඳහන් පරිදි සිදුවිණි.

<table>
<tr><th>විස්තරය</th><th>සටහන්</th><th>නියැලුණු පුද්ගලයන්</th></tr>
<tr><td>ජාතික රතු දත්ත නාමාවලිය ඇගැයීම සඳහා බීජක වර්ග විශේෂ අවෘත</td><td>1665</td><td rowspan="4">1. ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර<br>2. ඩී.එම්.යු.බී. ධනසේකර මහතා<br>3. ආචාර්ය ඒ.එම්.ඒ.එස්. අත්තනායක<br>4. ආර්.ඒ.එස්.ඩබ්.රණසිංහ මිය<br>5. එන්.පී.ටී. ගුණවර්ධන මිය<br>6. ජී. ෆොන්සේකා මිය<br>7. පරිසර අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කළ ව්‍යාපෘතිය යටතේ පත් කරන ලද දත්ත සකසන හය දෙනා</td></tr>
<tr><td>ජාතික රතු දත්ත නාමාවලිය ඇගැයීම සඳහා මීවන ශාක වර්ග</td><td>29</td></tr>
<tr><td>කුල එකතුව</td><td>116</td></tr>
<tr><td>සටහන් අංකවල එකතුව</td><td>46253</td></tr>
</table>

විශ්ව විද්‍යාල, ජෛව විවිධත්ව මහලේකම් කාර්යාලය සහ අනෙකුත් අදාල ආයතනවල ප්‍රවීණයන්ගේ සහාභාගිවීමෙන් කුල 127 අයත් වර්ග 1111 ජාතික රතු දත්ත ග්‍රන්ථය සඳහා ඇගැයිමට ලක් කරන ලදී.

## 5.4. පුහුණුව සහ අධ්‍යාපනය

ශාක ගවේෂණය පිළිබඳව, වැඩමුළු, ශාක ගවේෂණ හඳුනා ගැනිමේ, නම් කිරිම, ශාකාගාරය කළමනාකරණය කිරීම, ජෛව විවිධත්වය සහ එය රැක ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන්, දේශන, වැඩමුළු සහ රැස්වීම් පහත සඳහන් පරිදි මෙම වසරේදී සක්‍රියව ක්‍රියාත්මක කරන ලදී.



## 5.4.1. පුහුණු වැඩසටහන් සහ දේශන

| විස්තරය | විෂය | ඉලක්ක කණ්ඩායම/ආයතනය | සහාභාගි වුවන්ගේ සංඛ්‍යාව |
|---|---|---|---|
| එක්දින පුහුණු වැඩසටහන් | ශාකාගාරයේ ඉතිහාසය, ශාක ගවේෂණය සහ ශාකාගාර ශිල්පී ක්‍රම | පාසැල් සිසුන්<br>විශ්ව විද්‍යාල සිසුන්<br>වන ජීවී දෙපාර්තමේන්තුව<br>(රාජකීය උද්භිද උද්‍යානය) සහ සෙසු ආයතන | 224<br>175<br>94<br>149 |
| එක් දින දේශන | ජෛව විවිධත්වය සහ වර්ගීකරණ පර්යේෂණ<br>ඖෂධ පැළෑටි, ඊට සමාන පැළෑටි සහ ඒවායේ වාස භූමිය හඳුනා ගැනීම.<br>ග්‍රාමීය සංවර්ධනයේදී පැළෑටි සංරක්ෂණයේ වැදගත්කම | පුහුණුවන සිසුන් (රාජකීය උද්භිද උද්‍යානය)<br>සාම්ප්‍රදායික ආයුර්වේද වෘත්තියෙහි නියැලෙන්නන්<br>ගැමිදිරිය සංවිධානය යටතේ සමාජ සංවර්ධනය සහ ජීවනෝපාය ඉහල දැමීමේ ව්‍යාපෘතිය සඳහා සහාභාගිවුවන් | 09<br>100<br>29 |
| විශේෂ කර්මාන්ත පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය සහ පවත්වාගෙන යාම (සති දෙකක සහ සතියක වැඩසටහන්) | ශාකාගාරයේ සහ රාජකීය උද්භිද උද්‍යානයේ කාර්ය බණ්ඩයන්. | පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ තෙවැනි වසර උද්භිද විද්‍යා විශේෂවේදී උපාධිය හදාරන සිසුන්<br>කැළණිය විශ්ව විද්‍යාලයේ පුහුණුවන සිසුන්<br>වයඹ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයෙකු | 11<br>3<br>1 |

### 5.4.2 වැඩමුළු සහ රැස්වීම්

කොළඹ විශ්ව විද්‍යාලය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, පදනම් ආයතනය, තේ පර්යේෂණායතනය සහ ජාතික ශාකාගාරයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වියානා විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරුන් වන රෝස් සැමුවෙල් (Rose Samuel) සහ හනා ස්නිවෙයිස් (Hanna Schneeweiss) විසින් ශ්‍රී ලංකාවේ ශාකවල වර්ණදේහ ගණනය සහ න්‍යෂ්ටි දර්ශය පිළිබඳව දින පහක වැඩමුළුවක් පවත්වන ලදී.

පේරාදෙණිය සහ කොළඹ විශ්ව විද්‍යාලය, ජාතික ශාකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යයන කාර්ය මණ්ලයට, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අධිකරණ වෛද්‍ය විද්‍යා දෙපාර්තමේන්තුවේ ශිල්පීය කාර්ය මණ්ඩලයට සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූගර්භ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශිල්පීය කාර්ය මණ්ඩලය සඳහා වියානා විශ්ව විද්‍යාලයේ මහාචාර්ය මාටිනා වෙබර් (Martina Weber) විසින් පරාග සහ බීජාණු අධ්‍යයනය පිළිබඳව දින තුනක වැඩමුළුවක් පවත්වන ලදී.

## 5.5. ශාකාගාර නිදර්ශකවල සාමාන්‍ය නඩත්තු කටයුතු

| ක්‍රියාදාමය | මුදල |
|---|---|
| ශාකාගාර නිදර්ශක අලුත්වැඩියා කිරීම හා සහ රෝහණය කිරීම | 18,855 |
| කෘමි උවදුරට ලක්වූ නිදර්ශක සඳහා පිළියම් කිරීම (විෂ යෙදීම) | 452 |
| නිදර්ශක අධිශීතකරණයේ තැබීම | 3,926 |
| නිදර්ශක රෝහණය කිරීම | 818 |
| නිදර්ශක නැවත රෝහණය කිරීම | 138 |
| විශේෂ වලට ආවරණ එකතු කිරීම | 1298 |
| ගණවලට ආවරණ එකතු කිරීම | 761 |
| නිදර්ශක පවිත්‍ර කිරීම | 28,694 |
| ග්‍රන්ථ පවිත්‍ර කිරීම | 540 |
| නිදර්ශක කුට්ටනය කිරීම | 573 |
| සම්බන්ධක එකතු කිරීම | 520 |
| ලේබල් එකතු කිරීම | 969 |
| ගණවල ඇති ආවරණ සඳහා ලේබල් එකතු කිරීම | 511 |
| නැප්තලීන් මළු දැමීම | 125 kg |
| අලුත් එකතු සඳහා අලුත් නාම පුවරු ප්‍රතිශෝධනය කිරීම | 50 |


# 6. උද්භිද උද්‍යානය, හක්ගල

## 6.1. හැඳින්වීම



හක්ගල උද්භිද උද්‍යානය ශ්‍රී ලංකාවේ සිංකෝනා වගාව ප්‍රවර්ධනය සඳහා 1861 වර්ෂයේදි ආරම්භ කරන ලදි. මෙම උද්‍යානය ශ්‍රී ලංකාවේ දෙවැනි විශාලතම උද්භිද උද්‍යානය ලෙස සැලකේ. නුවරඑළියේ ජනාධිපති මැදුර සහ අගමැති නිළ නිවස මෙම උද්‍යානය විසින් පාලනය කරනු ලබයි. මෙම උද්‍යානය නුවරඑළිය - බදුල්ල මාර්ගයේ නුවරඑළියේ සිට 9.5 කි.මී. දුරකින් පිහිටා ඇත. මෙහි විශාලත්වය හෙක්ටයාර 27 කි.

## 6.2 පැළ නිෂ්පාදනය




පැළ නිෂ්පාදනය ප්‍රධාන වශයෙන් පොලිතීන් ගෘහ සහිත පැළ තවාන් දෙකක සහ ශාක ව්‍යාප්තිය සඳහා ඉදිවූ ශාක ගෘහයේ සිදු කරන ලදී. කැපූ මල් සඳහා වූ ශාක පොලිතීන් ගෘහයේ සහ එළිමහනේ වවන ලදි.

විවිධ ප්‍රමාණවලින් යුත් මල් පෝච්චි සඳහා වූ පැළ, කැබලි සහ බීජ පැළ 77,806 ක් නිෂ්පාදනය කරන ලදි. මෙය විකිණීම සඳහා ද උද්‍යානයේ වැවිලි කටයුතු සඳහා ද යොදා ගන්නා ලදි. පැළ 71,754 විකුණනු ලැබි ය. මෙය පසුගිය වසරට සාපේක්ෂ වර්ධනයකි, (62,181) උද්‍යානයේ පැළ තවාන්වලින් කිලෝග්‍රෑම් 16.878 ක බීජ එකතු කොට විකිණීම සඳහා ද උද්‍යානයේ භාවිතය සඳහා ද යොදා ගන්නා ලදි.

මල් බීජ පැකට් 9,460 නිෂ්පාදනය කොට ඉන් පැකට් 5,045 විකුණනු ලැබි ය. පැකට් 4,177 උද්‍යාන අලංකරණය කිරීම සඳහා භාවිත කරන ලදි.

## 6.3. විතැන් සංරක්ෂණය, ශාක ගවේෂණය

උද්‍යානයේ ශාක එකතුව විදේශික, දේශිය, ඒකදේශික,විරල, තර්ජණයට ලක් වී ඇති අවදානමට ලක් වී ඇති ශාක වැනි විවිධ වර්ගවල ශාකවලින් වැඩි දියුණු කිරීම ප්‍රධාන ඉලක්කයක් කර ගනිමින් කඳුකර ශාක උපනිවර්තන කාලගුණික තත්ත්වය යටතේ විතැන් සංරක්ෂණය කිරීම සිදු කරයි.

උද්‍යානයේ ශාක එකතුව වැඩි දියුණු කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

- උද්‍යානයේ රුක් උයනේ වර්ග 32 ට අයත් ශාක 366 රෝපණය කරන ලදි.
- දැඩි සුළං හේතුවෙන් බිම පතිත වූ ගස් ඉවත් කරන ලදි.
- අවශ්‍ය ස්ථානවල රුක් ශාඛා ඉවත් කරන ලදි.
- පැළ තවාන සඳහා නව ශාක එකතු කරන ලදි.
- ගස් සඳහා ලේබල් 350 ද තොරතුරු ලේබලයන් 40 ද සවි කරන ලදි.
- දම්වැල් අංශයට පහලින් පටක වගා කරන ලද ඩෙරෙන්ඩ්‍රොකැලමස් ගයිගන්ටියස් ශාක 70 ක් සිටුවන ලදී.
- මීවන ශාක වර්ග 8 ක් උපයෝගී කරගනිමින් තවාන් 20 ක නැවත රෝපණය සිදු කරන ලදී.

උද්‍යානයෙන් සහ පිටතින් දේශිය ශාක, බීජ රැස් කරගත් අතර බංගලා සංරක්ෂකගේ බංගලාව සමීපයේ අලුත්වැඩියා කරන ලද මඩුවේ වවන ලදී. (බෝ කරන ලදී). මඩුවේ බිජ 912 නඩත්තු කරන ලද අතර පැළ තවාන සඳහා බීජ පැළ 312 එකතු කරන ලදී.



ශාක බීජ පැළ තවානේ වැඩෙන අයුරු

## 6.4. පුහුණුව සහ අධ්‍යාපනය

ප්‍රධාන වශයෙන් මල්වගාව සහ භූමි අලංකරණය පිළිබඳ පුද්ගලයින් 334 ගේ ඉල්ලීම පරිදි පුහුණුවක් ලබාදෙන ලදී.

| පාඨමාලාව | සිසුන් | ඩිප්ලෝමා/ විශ්ව විද්‍යාල සිසුන් | රාජ්‍ය නිලධාරීන් | එකතුව |
|---|---|---|---|---|
| **භූමි අලංකරණය** | | 53 | 45 | **98** |
| **මල් වගාව** | | 122 | 35 | **157** |
| **ජෛව විවිධත්වය** | 66 | | 08 | **74** |
| **පාසැල් ව්‍යාපෘති** | 5 | | | **5** |
| **එකතුව** | **71** | **175** | **88** | **334** |

මල්වගාව සහ භූමි අලංකරණය පිළිබඳ සයමාසික පුහුණු වැඩසටහන ජාතික ආධුනිකත්ව සහ පුහුණු ආයතනයේ නුවරඑළිය ප්‍රාදේශිය කාර්යාලයේදී ආරම්භ කරන ලදී. සිසුන් හත්දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.

## 6.5. සංවර්ධන ක්‍රියාකාරකම්

### 6.5.1. ඉඩම් සංවර්ධනය




- ෂඩස්‍රාකාර කොන්ක්‍රීට් කැබලි මීවන උයන අභ්‍යන්තරයේ අතුරන ලදී. මීටර් 70 දිග ප්‍රමාණයක් කොන්ක්‍රීට් කැබලි 700 භාවිතයෙන් ආවරණය කරන ලදී.
- ජපන් උද්‍යානයේ ජලය බණ්ඩනය වීමේ පද්ධතිය සහ පාලම අසල කුඩා පොකුණ නැවත අලුත්වැඩියා කරන ලදී.
- ශිඛර උද්‍යානයේ අඩි පාරවල් අලුත්වැඩියා කිරීම ආරම්භ කළ අතර මීටර් 100 දිගු ප්‍රමාණයක් අලුත්වැඩියා කිරීම නිම කරන ලදී.
- රොඩෙඩොන්ඩ්‍රන් (රත්මල්) කුලයට අයත් මල් හට ගන්නා ශාක කොටසෙහි එම ශාක පාර සමඟ මීටර් 100 දිගු ප්‍රමාණයක පාර දෙපස සිටුවන ලදී.
- ප්‍රධාන පිවිසුමේ දෙපසින් මඩ පොකුණ ඇළ සමීපයේ පාර නැවත සකසන ලදී.

### 6.5.2. යටිතල පහසුකම් සංවර්ධනය

- පහළ මල් උද්‍යානයේ නොක් (Nock) අනුස්මරණ පොදු වැසිකිළි සංකීර්ණයේ වැසිකිළි වලවල් (අඩි 5 x 6 ප්‍රමාණයේ ) ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන ලදි.
- ග්‍රීෂ්ම කුටි 6 ක්, කාර්යාල, ගබඩා, පොකුණු 4 ක් සහ ගේට්ටු 3ක් තීන්ත ආලේප කරන ලදී.
- සංචාරක නිවාසයේ බිම දැව යොදා සැකසීම අවසන් කළ අතර කාමර 6 ක්, කෑම ශාලාව, විසිත්ත කාමරය, කොරිඩෝව තීන්ත ආලේප කරන ලදී. එමෙන්ම මෙම නිවාසයේ වහලය ද අළුත්වැඩියා කරන ලදී.
- සංචාරක නිවාසයේ කාමර 02 ක් සඳහා තනි ඇඳන් 4 ක්, කබඩ් 2 ක්, කණ්නාඩි මේස 2 ක්, ඇඳන් කබඩ් 02, මළු තබන රාක්ක 02 ක ආදී වශයෙන් අළුතින් ලී භාණ්ඩ යොදා අලංකාර කරන ලදි.
- කම්කරු නිල නිවාසයේ අළුත්වැඩියා කටයුතු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් නිම කරන ලදි.
- හරිතාගාරයේ එක් පැත්තක් විනිවිද රුලි ගැසුණු සීට්වලින් ආවරණය කරන ලදී.
- ප්‍රධාන මාර්ගයේ කි.මී. 1 ක් අළුත්වැඩියා කරන ලදී.


නව ගෘහ භාණ්ඩ සහ දැව පොළොව සහිත සංචාරක බංගලාව


අළුත්වැඩියා කරන ලද කම්කරු නිළ නිවාස


නව සීට් අතුරන ලද පැළැටි ගෘහය

## 6.6. අනෙකුත් ක්‍රියාකාරකම්

- නිදහස් දිනය සැමරිම සඳහා බුත්තල ප්‍රදේශය අලංකාර කිරිමේ අරමුණෙන් පෝච්චි කල පැළැටි 3000 ක් සකසන ලදි.
- අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දෙවන පදවිප්‍රාප්තිය සැමරිම සඳහා පැළැටි 113 ක් සිටුවන ලදි.
- කොසොරීනා මොන්ටානා ගස් 8 ක් රූට් බෝල් කර කේෂ්ත්‍රයේ සිටුවන ලදි.
- නාම පුවරු 27, සිතියම් 3 ක් හා දැන්වීම් පුවරු 7 ක් නරඹන්නන්හට තොරතුරු සැපයීම සඳහා උද්‍යානය තුළ සවි කරන ලදි .
- 2011.09.27 වන දින මාධ්‍යවේදීන් 20 ගේ සහාභාගිත්වයෙන් හා ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ සංවිධානයෙන් මාධ්‍ය සාකච්ඡාවක් උද්‍යානය තුළ පවත්වන ලදි.
- සීතාඑළිය පර්යේෂණ මධ්‍යස්ථානයේ පැවති ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශන කුටියක් සකස් කරන ලදී.

## 6.7. විශේෂ අමුත්තන්

- 2010.05.08 වන දින ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා උද්‍යානය නැරඹීමට පැමිණියේ ය.
- 2010.10.23 දින ශ්‍රී ලංකාවේ නේපාල තනාපති උද්‍යානය නැරඹීමට පැමිණියේ ය.
- ශ්‍රී ලංකාවේ බංගලාදේශ තානාපති 2010.10.24 දින උද්‍යානය නරඹා ඇත.

# 7. උද්භිද උද්‍යානය, ගම්පහ

## 7.1 හැඳින්වීම



ශ්‍රී ලංකාවේ රබර් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා හෙනරත්ගොඩ උද්භිද උද්‍යානය 1876 දී ස්ථාපිත කරන ලදී. එය ගම්පහ නගරයේ සිට කි.මී. 2 ක් නුදුරින් ගම්පහ මිනුවන්ගොඩ මාර්ගයේ පිහිටා ඇත. මුලින්ම එහි වපසරිය අක්කර 36 වූ අතර 2005 දී අක්කර 07 ක් ඊට එකතු කරනු ලැබී ය. එහි වර්තමාන වපසරිය අක්කර 43 ක් වේ. වර්ෂය තුළ දේශීය හා විදේශීය නරඹන්නන් 150000 අධික පිරිසක් විසින් මෙම උද්‍යානය නරඹා ඇත.

ප්‍රදේශයේ ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම සඳහා විතැන් සංරක්ෂණය, මල්වගාව හා භූමි අලංකරණය පිළිබඳ අධ්‍යාපන හා ව්‍යාප්ති සේවා, උද්භිද තොරතුරු බෙදා හැරීම උද්‍යාන විද්‍යාවේ අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මල් වගාව හා පටක රෝපණය පිළිබඳ පර්යේෂණ සිදු කිරිම, ආගමික හා ඓතිහාසික වශයෙන් වැදගත් වෘක්ෂ ආරක්ෂා කිරීම හා නඩත්තුව, අලෙවිය සහ සාමාන්‍ය නඩත්තු කිරීම සඳහා පැළැටි නිෂ්පාදනය, සුළු පරිමාණ මල්වගාකරුවන් සඳහා වෙළඳපලක් ලබා දිමට මල් ප්‍රදර්ශන සංවිධානය කිරීම ආදිය මෙම උද්‍යානය මගින් සිදු කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

## 7.2 යටිතල පහුසකම් සංවර්ධනය




නරඹන්නන් සඳහා ඉතා හොඳ සේවාවක් සැපයීම උදෙසා උද්‍යානයේ ශක්‍යතාව හා පහසුකම් වැඩිදියුණු කිරිමට පහත සඳහන් සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කරන ලදි.


- වැවට පිවිසෙන ප්‍රධාන පිවිසුමේ වැඩ කටයුතු නිම කිරීම.
- උද්‍යාන භූමිය තුළ අභ්‍යන්තර මාර්ග මීටර් 500 ක් පමණ තාර දමන ලදි.
- නව වැසිකිළි සංකිර්ණයේ වැඩකටයුතු නිම කිරීම.
- ප්‍රධාන දොරටුව අසල ආරක්ෂක කුටිය නවීකරණය කිරීම.

- වෘක්ෂ කුටිය සංවර්ධනය කිරීම.
- අලුතෙන් පිහිටුවනු ලැබූ ජලජ උද්‍යානයට හබල් බෝට්ටු තුනක් ලබා දීම.



## 7.3 පැළෑටි නිෂ්පාදනය

පැළෑටි විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද අතර පැළෑටි 15,614 අලෙවිය සඳහා නිෂ්පාදනය කරන ලදි.




පැළ නිෂ්පාදනය සහ අලෙවිය

## 7.4. අධ්‍යාපන හා පුහුණු





ඇන්තූරියම්, ඕකිඩ්, විසිතුරු පත්‍ර ශාක, රෝස, ජබේරා වගාව හා පැළ පටක රෝපණය ආදිය සඳහා පහත සඳහන් ලෙස එක් දවසක වැඩසටහනක් පැවැත්විණ.

| ප්‍රවර්ගය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූවන්ගේ සංඛ්‍යාව |
|---|---|---|
| ඇන්තූරියම් | 10 | 291 |
| ඕකිඩ් | 09 | 105 |
| පත්‍ර | 08 | 38 |
| ජර්බේරා | 08 | 40 |
| පැළ තවාන් කළමනාකරණය | 03 | 106 |
| උද්‍යාන භූමි අලංකරණය | 09 | 33 |
| වෙනත් | 16 | 926 |
| එකතුව | 63 | 1539 |

පහත සඳහන් වැඩමුළු "සුවහස් මල්" ව්‍යාපෘතිය මගින් සංවිධානය කරන ලදි.

| විෂය | සහභාගිවූවන්ගේ ප්‍රමාණය | වැඩමුළු ප්‍රමාණය |
|---|---|---|
| ජෛව විවිධත්වය | 143 | 05 |
| පොහොර | 190 | 03 |

# 8. ගනේවත්ත වන ඖෂධ උද්‍යානය

## 8.1 හැඳින්වීම



කුරුණෑගල සිට මීටර 15 ක් පමණ ඈතින් වයඹ පළාතේ ගනේවත්ත වන ඖෂධ උද්‍යානය පිහිටා ඇත. අන්තර් කළාපීය ප්‍රදේශයක පිහිටා තිබීම හේතුවෙන් ඖෂධ විශාල ප්‍රමාණයක් වගා කිරීම සඳහා ඉතා හොඳ පරිසරයක් බවට මෙම උයන පත් වී ඇත. මෙම උද්‍යානය අක්කර 52 ක වපසරියකින් යුක්ත වන අතර ඉන් භාගයක් පමණ පොල් වගාව සඳහා වෙන් වී ඇත. අක්කර 22 ක් ඖෂධ වගා කර ඇත.

මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වනුයේ පහසුවෙන් ලබාගත නොහැකි දුර්ලභ පැළෑටි වර්ග සංරක්ෂණය කිරිම, ඖෂධ පැළෑටි පිළිබඳ ක්‍රමවත් වගා කිරිමක් හා පැළෑටි එකතු කිරිමේ ක්‍රම සම්බන්ධ පැහැදිලි කිරිම හා දුර්ලභ වර්ග පිළිබඳ පරීක්ෂා කිරීම යන කරුණු ය.

## 8.2. 2010 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්

උද්‍යාන භූමිය හා මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම, උද්‍යානයේ වැට, ආවරණ කුටි, ගරාජය ගොඩනැගිම, උද්‍යාන නිලධාරින්ගේ නිල නිවස සදා නිම කිරීම හා පැළ සිටුවිමේ වැඩසටහන් කඩිනම් කිරීම වැනි ක්‍රියාකාරකම් තුළින් උද්‍යානය සම්බන්ධ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී. මෙහි ක්‍රියාත්මක කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ පැල 16,731 ක් නිෂ්පාදනය කරන ලද අතර 11,329 අලෙවි කරන ලදි.

උද්‍යානයේ ඖෂධ පැළෑටි තොරතුරු ලබා ගැනිම, ඖෂධ සංරක්ෂණය හා භාවිතය පිළිබඳ දැනුම ලබා ගැනිම උදෙසා නරඹන්නන් 395 උද්‍යානය නරඹා ඇති අතර පුද්ගලයන් 49 දෙනෙකු උද්‍යානය වෙත පැමිණ ඔවුන්ගේ අවශ්‍යතා සඳහා ඖෂධ ලබාගෙන ඇත.

## 9. වියළි කලාපීය උද්භිද උද්‍යානය , හම්බන්තොට

### 9.1. හැඳින්වීම



දේශීය විශේෂඥයන් අවු : 130 ක් පුරාවට සැලසුම් කොට බිහිවූ ශ්‍රී ලංකාවේ ප්‍රථම උද්භිද උද්‍යානය වනුයේ වියළි කලාපීය උද්භිද උද්‍යානයයි. මෙම උද්‍යානය දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මිරිජ්ජවිල ප්‍රදේශයේ පිහිටා ඇති අතර, සංවර්ධන වැඩ කටයුතු 2006 වර්ෂයේ ආරම්භ වී ඇත.

විවිධ වූ මානව ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලයක් ලෙස වියළි කලාපීය කැලෑ වෘක්ෂලතා ඉතා ශීඝ්‍රයෙන් වැනසී ගොස් ඇති අතර පසුගිය වසර 30 ක කාලය තුල හම්බන්තොට ප්‍රදේශයේ වියළි කළාපීය වෘක්ෂලතා 98% කින් වැනසී ගොස් ඇත. මෙම උද්‍යානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වනුයේ කෙටි කාලීන හා දීර්ඝකාලීනව වියළි හා ශුෂ්ක කළාපීය පැළෑටි සංරක්ෂණය කිරීම වියළි කලාපයේ එතරම් නොදන්නා මෙන්ම මේ දක්වා භාවිත කොට නැති පැළෑටි වර්ග පිළිබඳව අධ්‍යනය කිරීම, ඖෂධ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, වියළි කලාපයේ උද්භිද විද්‍යාව හා මල් වගාව පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුව ලබා දීම යන කටයුතුය.

### 9.2. 2010 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන්



උද්‍යානයේ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීමේ අරමුණෙන් අභ්‍යන්තර මාර්ග පද්ධතියේ ගොඩනැගීම් කටයුතු සිදු කරන ලදී. උද්‍යානයේ පැළ තවාන් සඳහා කාර්යක්ෂම ලෙස ජලය සපයනු වස් ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතිය යටතේ අභ්‍යන්තර වාරි මාර්ග පද්ධතිය නිම කරන ලදී. වගා කිරීමේ වැඩසටහන්වල තත්ත්වය හා ශක්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා නිදන ශාලාවක් සහිත නව ක්ෂේත්‍ර කාර්යාලයක් හා ආවරණ කුටි ඉදි කරන ලදී.





මලිත්තන්ගස් වැව හා දෙමතෙන්න වැව යන අභ්‍යන්තර වැව්වල තත්ත්වය ඉහල නංවන ලදි. උද්‍යානය සඳහා ඵලදායි ලෙස ජලය පොම්ප කිරීම සඳහා අභ්‍යන්තර අමු ජලය බෙදා හැරිමේ පද්ධතියක් පිහිටුවන ලදි. මෙම ඉදිකිරිම්වලට අකුණු ගැසිමෙන් ඇතිවන අලාභහානි වැලැක්විම සඳහා අකුණු ආරක්ෂණ පද්ධතියක් පිහිටුවන ලද අතර, කාලගුණය පිළිබඳ තොරතුරු ක්‍රමවත්ව ලබා ගැනිම සඳහා මෙන්ම මෙහෙයවිම සඳහා කාලගුණ මධ්‍යස්ථානයක් ද පිහිටුවන ලදි.

උද්‍යානයේ යකඩ බංකු 45 සාදන ලද අතර ගෘහස්ත පැළැටි සඳහා ආරුක්කුවක් ද සාදන ලදි. විවිධ ප්‍රමාණයේ සිමෙන්ති මල් පෝච්චි 284 ද නිර්මාණය කිරීමේ කටයුතු සිදුවෙමින් පැවතිණ. ඖෂධ සඳහා භූමිය සකස් කිරිම සඳහාත් මල් උද්‍යාන හා කුඩා මාවත් නිර්මාණය කිරීම සඳහාත් බැලේරියා වැට ව්‍යාප්ත කිරීම සඳහාත් භූමි සංවර්ධන වැඩ කටයුතු තවදුරටත් සිදුකෙරෙමින් පැවතිණ.

දේශීය ශාක වර්ග 12 කට අයත් ඒකළ පැළැටි 68 ක් එකතු කොට උද්‍යානයේ දැනට පවත්නා ශාක එකතුවට එක් කරන ලදි.

විසිතුරු පැළැටි 5975 ක් ද කැලෑ ශාක 90 ක්ද ප්‍රචාරණය කරන ලද අතර ඇන්තූරියම් පැළ 50, ඕකිඩ් පැළ 40, එළිමහන් හා ගෘහස්ථ පැළ 500 ක්ද පැළ තවාන් වලදී ප්‍රචාරනය කරන ලදි.

රුක් උයන හා මාවත්වල කැලෑ ශාක 203 හා විසිතුරු පැළ 2730 ක් සිටුවන ලදි. කාලගුණයේ ඍතුමය හා අන්තර් වාර්ෂික වෙනස්විම් ආවර්තන පැළැටි වර්ග 08 ක් සඳහා බලපාන අන්දම අධ්‍යයනය කිරීම සඳහා ඍතු වල විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදි.



# 10. තෙත් කලාපිය උද්භිද උද්‍යානය, අවිස්සාවේල්ල

## 10.1. හැඳින්වීම



උද්‍යානයේ වපසරිය අක්කර 62 ක් වන අතර, එය බස්නාහිර පළාතේ අවිස්සාවේල්ල ඉලුක්ඕවිට ප්‍රදේශයේ ඉලුක්ඕවිට ප්‍රාථමික පාසලට යාබදව පිහිටා ඇත. ප්‍රදේශයේ වඳවීමට ලක් වි ඇති මල් මෙම උද්‍යානය මගින් ඉතා හොඳින් සංරක්ෂණය කරනු ලබන අතර දිවයිනේ සංචාරක කර්මාන්තය හා මල් වගා ක්ෂේත්‍රය ඉහළ නංවයි. උද්භිද විද්‍යාව හා පරිසර විද්‍යාව හදාරන සිසුන් හා පර්යේෂකයන් සඳහා රසායනාගාර ප්‍රදේශයක් ලෙසත්, අධ්‍යාපනික පර්යේෂණ සඳහා සුදුසු පරිසරයක් ලෙසත්, පුද්ගලයන් සඳහා විනෝදාස්වාදය ගෙන දෙන ප්‍රදේශයක් ලෙසත් මෙම උද්‍යානය එහි කාර්යයන් සිදු කරයි. මෙම උද්‍යානයේ ප්‍රධාන අරමුණ වන්නේ තෙත් කලාපීය භූමිය වැඩි කිරීමත් සමඟ තෙත් පහත් බිම්වල ශාක සම්බන්ධ විතැන් සංරක්ෂණය සිදු කිරීමයි.

## 10.2. 2010 වර්ෂයේදී සිදු කරන ලද කාර්යයන්



අක්කර 2-3 තණකොළ සිටුවා තණ පිට්ටනියක් ලෙස සකසා භූමි අලංකරණ කටයුතු සිදු කරන ලද අතර පොකුණු තුනකින් යුත් ජල උද්‍යානයක් ලෙස කුඹුක් උයන සංවර්ධනය කරන ලදී.

එමෙන්ම කුඩා වැව් සම්බන්ධයෙන් ද සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතී.

ගෘහ භාණ්ඩ, ජලය, විදුලිය, අන්තර්ජාල පහසුකම් ආදිය පහසුකම් සහිත නව කාර්යාල ගොඩනැගිල්ලක ඉදිකිරීම් කටයුතු නිම කළ අතර අවසර නොමැතිව ඇතුල්වීම වැලැක්වීම සඳහා උද්‍යානයේ ඉදිරිපිට තාවකාලික වැටක් ඉදි කරන ලදි.





ඇන්තූරියම් හා ඕකිඩ් වගා කිරීම සඳහා බහු උමං මාර්ග ලෙස මල් තවාන් ස්ථාපනය කරන ලදි. මෙරන්ගි (සුදු) පැළ 500 ක් ද කැලිස්ටෝ (රතු) පැල 500 ක් ද මෙම පැළ තවාන්වල නඩත්තු කරන ලදි. පැළ තවාන්වල අඟල් 2ක් උස පෝච්චි ගත ඕකිඩ් නිරෝගී ලෙස නඩත්තු කරනු ලැබූ අතර විතැන් සංරක්ෂණය සඳහා විශේෂ පැළ සිටුවීමේ වැඩසටහන් පවත්වන ලදී.



## 11. අතිගරු ජනාධිපතිතුමාගේ හා ගරු අගමැතිතුමාගේ නිළ නිවාස උද්‍යාන

අතිගරු ජනාධිපතිතුමාගේ හා ගරු අගමැතිතුමාගේ කොළඹ, මහනුවර, අනුරාධපුරය හා නුවරඑළිය පිහිටා ඇති නිළ නිවාස බද උද්‍යාන උසස් ලෙස නඩත්තු කරන ලදි. ගරු අගමැතිතුමාගේ කොළඹ පිහිටි නිල නිවසේ උද්‍යාන සංවර්ධන කටයුතු සාර්ථකව නිම කරන ලදි. භූමි අලංකරණය හා උද්‍යානයේ භාවිතය සඳහා උපකරණ යන්ත්‍ර මිලදී ගන්නා ලදි. මල්, එළවළු හා පළතුරු පැළ , තවාන් වල සාර්ථකව නඩත්තු කොට එදිනෙදා අවශ්‍යතා සඳහා මල්, එළවළු හා පළතුරු සපයනු ලැබේ.



## 12. පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සොහොන් ඒකක

මහනුවර,ජාවත්ත බොරුල්ල සහ ත්‍රිකුණාමලයේ පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සෙහොන් ඒකක ඉහල තත්ත්වයකින් පවත්වාගෙන යනු ඇත. ජාවත්ත, බොරුල්ල සහ මහනුවර පිහිටි පොදු රාජ්‍ය මණ්ඩලීය යුධ සෙහොන් ඒකක වැඩි දියුණු කරන ලදී. ත්‍රිකුණාමලයේ පිහිටි යුධ සෙහොන් ඒකකය සඳහා ජලය ඉසින ක්‍රමය ස්ථාපනය කළ අතර යුධ සොහොන් උද්‍යානය වැඩි දියුණු කරන ලදී.



වැඩි දියුණු කරන ලද
ජාවත්ත යුධ සොහොන් ඒකකය



වැඩි දියුණු කරන ලද
මහනුවර යුධ සොහොන් ඒකකය



වැඩි දියුණු කරන ලද
ත්‍රිකුණාමලය යුධ සොහොන් ඒකකය







ත්‍රිකුණාමලයේ යුධ සොහොන් ඒකකයේ
අලුතින් ස්ථාපනය කරන ලද ජලය ඉසින ක්‍රමය

## 2011 වර්ෂය සඳහා සැලසුම් කළ ක්‍රියාකාරකම්

| මහින්ද චින්තන වැඩසටහන | සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් |
| --- | --- |
| **පාරිසරික සංරක්ෂණය සහ පරිසර හිතකාමී සංචාරක ප්‍රවර්ධනය සඳහා දිගුකාලීන ප්‍රතිපත්තියක්** | **පහතරට වියළි කලාපීය ශාක සංරක්ෂණය කිරීම සඳහා ආරම්භ කරන ලද මිරිජ්ජවිල උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු දිගටම පවත්වා ගෙන යාම**<br>1. උයන් කුටි ඉදි කිරීම.<br>2. පිවිසුම් සංකීර්ණයක් රථගාලක් ඉදිකිරීම.<br>3. මල් වගා අංශය සඳහා කාර්යාලයක් ඉදිකිරීම.<br>4. ක්ෂේත්‍ර කාර්යාලයක් සහ සේවා අංගණ කාර්යාලයක් ඉදි කිරීම.<br>5. පැළ කිරීම සහ පැළෑටි සංරක්ෂණ වැඩසටහන<br>6. භූමි අලංකරණය සංවර්ධන ක්‍රියාකාරකම්.<br><br>පහතරට තෙත් කලාපීය ශාක සංරක්ෂණය කිරීම සඳහා ආරම්භ කරන ලද අවිස්සාවේල්ල ඉලුක්ඕවිට උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු දිගමට පවත්වා ගෙන යාම<br>1. රථගාලක් ඉදි කිරීම.<br>2. ටිකට් කවුන්ටරයක් සහ ප්‍රධාන පිවිසුමක් ඉදි කිරීම.<br>3. කුඹුක් උද්‍යානයේ වැඩ නිම කිරීම.<br>4. අභ්‍යන්තර මාර්ග පද්ධතියක් ඇති කිරීම<br>5. මල් වගාව පිළිබඳව ව්‍යාප්ති වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.<br>6. ආපන ශාලාවක් ඉදි කිරීම. |
| **ජෛව විවිධත්ව සංරක්ෂණය තහවුරු කිරීම** | 1. ලයිකන්, බ්‍රයෝශාකීය වැනි පහත් ශාක පිළිබඳව අධ්‍යයනය දිගටම පවත්වා ගෙන යාම.<br>2. ශ්‍රී ලංකාවේ ශාක ලැයිස්තුව සංශෝධනය .<br>3. ශ්‍රී ලංකාවේ ශාක සඳහා රතු දත්ත නාමාවලිය සැපයීම.<br>4. ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳව විතැන් සංරක්ෂණය.<br>5. ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ ශාකවල ජනකප්ලාස්මය වැඩි දියුණු කිරීම.<br>6. ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ශාක පිළිබඳව දත්ත සමුදායක් පිළියෙල කිරීමට මුල පිරීම.<br>7. ඓතිහාසික සහ ආගමික වැදගත්කමකින් යුත් වෘක්ෂයන් සංරක්ෂණය කිරීම දිගට ම පවත්වාගෙන යාම.<br>8. අවම වශයෙන් සෑම උද්භිද උද්‍යානයකම ක්ෂේත්‍ර ගවේෂණ 10 ක් පවත්වාගෙන යාම.<br>9. ශාකාගාර නිදර්ශක පරිගණක ගත කිරීම. |

| | |
|---|---|
| | 10. ශ්‍රී ලංකාවේ ශාක පිළිබඳව ව්‍යුහ විද්‍යාත්මක ගවේෂණයක් කිරීම. |
| **මල්වගාවේ යෙදෙන්නන්හට අත්‍යවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් හැකියාවන්ගෙන් සන්නද්ධ කිරීම** | 1. මල් වගාව සහ භූමි අලංකරණ උද්‍යාන පාලනය පිළිබඳව දේශන සහ වැඩමුළු පවත්වාගෙන යාම.<br>2. උද්භිද උද්‍යාන අභ්‍යන්තරයේ සහ බාහිරව මල් වගාව, පරිසර සංරක්ෂණය පිළිබඳව ප්‍රදර්ශන පැවැත්වීම.<br>3. මල්වගාව සහ භූමි අලංකරණ උද්‍යාන පාලනය පිළිබඳව අත් පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම, රූපවාහිනි වැඩසටහන් පවත්වාගෙන යාම.<br>4. මල්වගාකරුවන්ගේ සංවිධාන පිහිටුවීම තුළින් මල්වගාකරුවන් සංවිධානය කිරීම.<br>5. රටෙහි මල් වගා කර්මාන්තය නඟා සිටුවීම සඳහා මල්වගා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>6. දිවයින පුරා කැපු මල් අලෙවි මධ්‍යස්ථාන පිහිටු වීම. |
| **විභවයක් ඇති විසිතුරු ශාක පිළිබඳව දිගුකාලීන සහ කෙටිකාලීන පර්යේෂණ වැඩසටහන් ආරම්භ කිරීම.** | 1. මල්වගාමය විභවයක් ඇති දේශිය ශාක ගවේෂණය, නව වර්ග නිෂ්පාදනය සහ මෙවන් ශාක වෙළඳපලට හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම.<br>2. විදේශිය රටවලින් ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය ආනයනය කිරීම.<br>3. පෙර සහ පසු අස්වැන්න ක්‍රමවේද පිළිබඳව පර්යේෂණ සිදු කිරීම.<br>4. පටක රෝපණය සහ ජෛව තාක්ෂණය පිළිබඳව පර්යේෂණ සිදු කිරීම.<br>5. මල්වගා කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා ජලජ ශාක, අගය එකතු කරන ලද නිෂ්පාදන සහ වියළි මල් පිළිබඳව පර්යේෂණ සිදු කිරීම. |
| **ජීවනෝපාය නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.** | 1. මල්වගා සහ ශාක සංරක්ෂණය පිළිබඳව තෙමස්, වසරක සහ දැවුරුදු පාඨමාලා පැවැත්වීම.<br>2. අලංකරණ ගෙවතු වැවීම සහ ශාක සංරක්ෂණය පිළිබඳව උපදේශන සේවාව ලබා දීම. |